2020

වාර්ෂික වාර්තාව

வருடாந்த அறிக்கை

ANNUAL REPORT



ජාතික තරුණ සේවා සභාව

தேசிய இளைஞர் சேவைகள் மன்றம் National Youth Services Council

වාර්ෂික වාර්තාව

2020

ජාතික තරුණ සේවා සභාව

හැඳින්වීම.

ජාතික තරුණ සේවා සභාව 2020 වසර තුළ, විවිධ ව්‍යසනයන් හමුවේ ද විශේෂ ජයග්‍රහණ ලබා ඇති අතර, විවිධ අභියෝග ජයගනිමින් සිදු කරන ලද ක්‍රියාකාරකම්හි ප්‍රතිඵල මෙම වාර්ෂික වාර්තාව තුළ අන්තර්ගතව පවතී. තරුණ ප්‍රජාව සම්බන්ධ කරගනිමින් තරුණ සංවර්ධන වැඩසටහන් නව මුහුණුවරකින් ක්‍රියාවට නංවමින් ආයතනයේ ඉදිරි ඉලක්ක ජයග්‍රහණය කිරීමට යොදාගත් උපක්‍රම හා ඉන් ලබාගත් ප්‍රතිඵලයන් මේ තුළින් දක්වා ඇත.

බාහිර පාර්ශවයටද ආයතනය පිළිබඳ ප්‍රතිරූපයක් ගොඩනගා ගැනීමට මෙම වාර්ෂික වාර්තාව ඉවහල් වේ. විශේෂයෙන් අදාළ වර්ධය තුල ලබා දී ඇති ප්‍රතිපාදනයන්ට සාපේක්ෂව සිදු කර ඇති තරුණ සංවර්ධන වැඩසටහන්හි කාර්ය සාධනයන් මැන බැලීම සඳහා ද වැදගත් වේ. තවද රාජ්‍ය නොවන හා තරුණ කටයුතු ක්‍රියාත්මක කරනු ලබන පාර්ශවයන්ට තරුණ සේවා සභාව සමඟ අත්වැල් බැඳගැනීමට අවශ්‍ය තීරණ රැසක් මෙම වාර්ෂික වාර්තාව තුළින් ලබා ගැනීමට හැකියාවක් ඇත.

සෞභාග්‍යයේ දැක්ම ජාතික ප්‍රතිපත්තියට අනුව අපේක්ෂිත දිශානතිය තුල තරුණ සංවර්ධන ක්‍රියාකාරකම් ගමන් කළේද යන්න අවබෝධ කර ගැනීමට වාර්ෂික වාර්තාව බෙහෙවිනන් වැදගත් වේ. ශ්‍රී ලාංකේය තරුණ ප්‍රජාවගේ අවශ්‍යතා හඳුනාගනිමින් ඔවුන්ට සෘජු ප්‍රතිලාභ ලබා දීම සඳහා විවිධාංගීකරණය වූ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ජාතික තරුණ සේවා සභාවේ එක් අරමුණකි. එම අරමුණු සපුරා ගැනීම සඳහා තරුණ සංවර්ධන, ව්‍යවසායකත්ව සංවර්ධන, විවිධ කුසලතා සංවර්ධන මෙන්ම වෘත්තීය පුහුණු කටයුතු ආදී විවිධ වැඩසටහන් ක්‍රියාත්මක වන අතරම ජාතික ප්‍රතිපත්ති රාමුව තුළ පිහිටා රට හඳන සෞභාග්‍යයේ දැක්ම අනුව මෙන්ම තිරසාර සංවර්ධන අරමුණු සාධනය වන අයුරින් 2020 වසරේදී වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.

තරුණ තරුණියන්ගේ අධ්‍යාපනය හා පුහුණු පැතිකඩ සංවර්ධනය සඳහා වෘත්තීය පුහුණු, ක්‍රීඩා සංස්කෘතික වැඩසටහන් හා නිපුනතා සංවර්ධන වැඩසටහන් රැසක් සිදුකරන ලදි. ව්‍යවසායකත්ව සංවර්ධනයට ව්‍යාපාරික අවස්ථා සඳහා නව තාක්ෂණය හඳුන්වා දීම, ව්‍යාපාරික අවස්ථා පුළුල් කිරීමට වැඩසටහන් දියත් කරන ලදි. තරුණ සහභාගීත්වය හා පිළිගැනීම සඳහා තරුණයා සවිබල ගැන්වීමට, සංවිධානය කිරීමට, ඔවුන්ගෙ නායකත්ව පෞරුෂය වර්ධනය වන වැඩසටහන් දියත් කෙරුණි. මත්ද්‍රව්‍ය හා වාත්තීය පුහුණු මඟින් තාරුණ්‍යය සෞඛ්‍ය, යහපැවැත්ම තහවුරු කෙරුණි. තරුණ සංවර්ධනයට අදාළ කාර්ය මණ්ඩල බලගැන්වීම, තාක්ෂණය ආයතනය තුළ සවිමත් කිරීම 2020 වසර තුළ සිදු වූ සුවිශේෂී ප්‍රයත්නයන් වේ.

තරුණ සංවර්ධනයේ නියමුවා ලෙස ආයතනික ඉලක්ක කරා ගමන් කිරීමේදී භෞතික හා මූල්‍ය ඉලක්ක ගොඩනගා ගනිමින් ඒ හරහා විශාල සේවා රැසක් තරුණ පරම්පරාව වෙත දායාද කිරීමේ අභිප්‍රායෙන් සිදු කළ ක්‍රියාන්විතයේ තොරතුරු 2020 වාර්ෂික වාර්තාව ඇසුරින් පිළිඹිඹු වේ.

ජාතික තරුණ සේවා සභාවේ සියලු ආයතනික කාර්යයන් සාර්ථක කර ගැනීම සඳහා මාර්ගෝපදේශකත්වය, නායකත්වය සපයනු ලැබූ තරුණ හා ක්‍රීඩා අමාත්‍ය තුමා ඇතුළු අමාත්‍යාංශයේ සියලු නිළධාරීන්ට ද ජාතික තරුණ සේවා සභාවේ සභාපති / අධ්‍යක්ෂ ජනරාල් තුමා ඇතුළු සියලුම කාර්ය මණ්ඩලය ගෞරවාන්විතව සිහිපත් කරමු.

සැලසුම් හා ප්‍රගති සමාලෝචන, නිළධාරී පුහුණු අංශය

දැක්ම

බලසතු වූ ශ්‍රී ලාංකීය තරුණයෙක්.

මෙහෙවර

දේශීය හා ජාත්‍යන්තර අවස්ථා උපයෝගී කොටගෙන ජීවිත අභියෝග සඳහා මුහුණ දීමට ශ්‍රී ලාංකීය තරුණයා සවිබල ගැන්වීම සඳහා පහසුකම් සැපයීම.

අරමුණු

- ජාතික හැඟුම පිළිබඳ උද්යෝගයක්, විනය පිළිබඳ හැඟීමක්, සමාජ හා ආර්ථික ගැටළු පිළිබඳ අවබෝධයක් සහ ශ්‍රමාභිමානය පිළිබඳ හැඟීමක් තරුණයන් අතර පෝෂණය කිරීම.
- ජාතික සංවර්ධන යෝජනා ක්‍රමයන්හි තරුණයන්ගේ සහභාගිත්වය ඇති කර ගැනීම.
- ශ්‍රී ලංකාවේ හා වෙනත් රටවල තරුණයන් අතර සුහදතාවය සහ අන්‍යෝන්‍ය අවබෝධය ප්‍රවර්ධනය කිරීම.
- තරුණයන් අතර තරගකාරිත්වය හා ජයග්‍රහණය පිළිබඳ හැඟීම සඳහා දිරිගැන්වීම.
- තරුණයන්ගේ දැනුම පුළුල් කිරීම සහ සංවර්ධනයට අදාළ ක්ෂේත්‍රයන්හි පුහුණුවීම ලබාදීම.
- තරුණයන් අතර සංස්කෘතික සාහිත්‍යමය හා කලාත්මක ක්‍රියාකාරකම් සඳහා දිරි ගැන්වීම.
- තරුණයන් අතර ශාරීරික ප්‍රාගුණය හා ක්‍රීඩා වර්ධනය සඳහා දිරි ගැන්වීම.
- තරුණයන් සඳහා විනෝද කටයුතු සහ විනෝද සැපයුම් පිළිබඳ පහසුකම් සැලසීම.
- ආබාධිත තරුණයන්ට සහය වීම.
- රජයේ ආර්ථික සැළසුම ශක්තිමත් කිරීමේ අරමුණ ඇතිව, දීර්ඝ කාලීන ප්‍රතිපත්ති පදනමක් මත ඵලදායී ලෙස අරමුදල් ආයෝජනය කිරීමෙන් තරුණයන් සඳහා ක්‍රමික සේවා නියුක්තිය සඳහා අවස්ථාව සැලසීම.
- ප්‍රතිපත්ති සැකසීමේ හා ක්‍රියාත්මක කිරීමේ දී තරුණයන්ගේ සහභාගිත්වය සඳහා අවස්ථාව සැලසීම.
- තරුණ සංවිධානය පිහිටුවීම සහ තරුණ සුභ සාධනය සඳහා දැනටමත් පිහිටුවා ඇති සංවිධාන වලට සහය වීම.
- තරුණ සේවා ව්‍යාප්තිය සැළසුම් කිරීම, ඒකාබද්ධ කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ මෙහෙයවීම.
- එක් එක් තරුණයාගේ ආවේනික ලක්ෂණ වර්ධනය කිරීම.

පටුන

හැඳින්වීම. III

දැක්ම IV

මෙහෙවර IV

අරමුණු V

1.ජාතික තරුණ සේවා සභාව 3

1.1 සංවිධාන ව්‍යුහය 4

1.2 සභා අධ්‍යක්ෂ මණ්ඩලයේ නාම ලේඛණය 5

2. විගණක හා කළමනාකරණ කමිටුව - 2020 7

3. ජාතික තරුණ සේවා සභාවේ ලැබීම් හා වියදම් පිලිබඳ විස්තරය 8

ජාතික තරුණ සේවා සභාවේ 2020 වර්ෂයේ ප්‍රතිපාදන ලැබීම් 8

ජාතික තරුණ සේවා සභාවේ 2020 වර්ෂයේ ප්‍රතිපාදන ගෙවීම් 9

සංවර්ධන වැඩසටහන් වියදම් සාරාංශය - 2020 11

4. සංවර්ධන ක්‍රියාකාරකම් - 2020 12

4.1 තරුණ සංවිධාන හා සංවර්ධන ක්‍රියාකාරකම්. 12

4.2 වෘත්තීය මාර්ගෝපදේශන හා උපදේශන ක්‍රියාකාරකම්. 13

4.3 ක්‍රීඩා සංවර්ධන ක්‍රියාකාරකම් 14

4.4 සෞන්දර්ය කුසලතා සංවර්ධන ක්‍රියාකාරකම් 15

4.5 කාර්මික හා වෘත්තීය පුහුණු ක්‍රියාකාරකම් 16

4.6 ජාත්‍යන්තර තරුණ සබඳතා ක්‍රියාකාරකම් 17

4.7 නිස්කොා විඩියෝ ක්‍රියාකාරම් 18

4.8 ගොවිපළ සංවර්ධන ක්‍රියාකාරකම් 19

4.9 සැළසුම්, ප්‍රගති සමාලෝචන හා නිළධාරී පුහුණු අංශය 20

4.10 පර්යේෂණ, කාර්යසාධන ඇගයීම් හා සුභසාධනය 20

4.11 මාධ්‍ය අංශය 21

4.12 තොරතුරු තාක්ෂණ ක්‍රියාකාරකම්. 21

4.13 විභාග හා ඇගයීම් අංශය. 22

4.14 විශේෂ ව්‍යාපෘති අංශය 23

4.15 යෞවන නිළිණ අධිකාරිය. 23

4.16 තරුණ සමූපකාර හා ව්‍යාපාර සහ සංවර්ධන අංශය. 24

5.පාලන අංශයේ ක්‍රියාකාරකම් 25

5.1ආයතනික කටයුතු. 25

5.2 ප්‍රසම්පාදන අංශය. 25

5.3 ප්‍රවාහන අංශය. 26

5.4 අභ්‍යන්තර විගණක අංශය. 26
5.5 ලේකම් අංශය. 26
5.6 නීති විමර්ෂණ ක්‍රියාකාරකම්. 26
5.7 ඉදිකිරීම් ක්‍රියාකාරකම් 26
6. ස්වේච්ඡා වැඩසටහන් 27
7. කාර්යයසාධන වාර්තාව - 2020 29
අ.ආයතනයේ කාර්ය සාධනය 29
ආ. කෙටිකාලීන හා මධ්‍යකාලීන ක්‍රියාමාර්ග 31
8. 2020 වර්ෂයට අදාළ විගණන විමසුම් මඟින් දක්වා ඇති කරුණු නිවැරදි කිරීමට ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව. 32
09.ආශ්‍රිත වාර්තා / ලේඛන 36
ඇමුණුම 01 37
විගණක කමිටු වාර්තාව 37
ඇමුණුම් 02 38
මූල්‍ය විගණක ප්‍රකාශය. 38
ඇමුණුම් 03 - විගණකාධිපති වාර්තාව හා ජාතික තරුණ සේවා සභාවේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහාවූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව 40
ඇමුණුම් 04 - ජාතික කරුණ සේවා සභාවේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ එහි කටයුතු පිලිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණකාධිපති වාර්තාව සම්බන්ධ ප්‍රගතිය. 47

1.ජාතික තරුණ සේවා සභාව

ශ්‍රී ලංකාවේ තරුණ තරුණියන්ගේ පූර්ණ වර්ධනය සහතික කිරීමට හැකිවන පරිදි ඔවුන්ගේ ස්වාර්ථයන් ප්‍රවර්ධනය කිරීම සඳහා පිහිටුවා ඇති එකම රාජ්‍ය ආයතනය ජාතික තරුණ සේවා සභාව වේ.

<u>ජාතික තරුණ සේවා සභාව පිහිටුවීමට අදාළ පාර්ලිමේන්තු පනත් :-</u>

- 1967 වර්ෂයේ අංක 11 දරණ ස්වේච්ඡා ජාතික තරුණ සේවා පනත.
- 1968 වර්ෂයේ අංක 52 දරණ ස්වේච්ඡා ජාතික තරුණ සේවා (සංශෝධිත) පනත.
- 1969 ජනවාරි 23 වන දින අංක 14837/6 දරණ අති විශේෂ ගැසට් පත්‍ර මඟින් පනතේ 26 වන ඡේදනට අනුව රෙගුලාසි මාලාව ප්‍රකාශයට පත් කිරීම.
- 1979 වර්ෂයේ අංක 69 දරණ ජාතික තරුණ සේවා පනත.
- 1979 දෙසැම්බර් මස 20 වන දින අංක 67/09 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මගින් 1967 අංක 11 දරණ ස්වේච්ඡා ජාතික තරුණ සේවා (සංශෝධන) පනත අහෝසි කිරීම හා 1979 අංක 69 දරණ ජාතික තරුණ සේවා පනත ක්‍රියාත්මක කරන දිනය ප්‍රකාශයට පත් කිරීම.
- 1980 ජනවාරි මස 02 වන දින අංක 69/09 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් 1979 අංක 69 දරණ ජාතික තරුණ සේවා පනතේ 34 වන වගන්තිය යටතේ රෙගුලාසි මාලාව ප්‍රකාශයට පත්කිරීම.
- 1986 මාර්තු මස 10 වන දින අංක 392/05 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මඟින් 1979 ජාතික තරුණ සේවා පනතේ 34 වන වගන්තිය යටතේ 1986 අංක 01 දරණ ජාතික තරුණ සේවා නියෝග ප්‍රකාශයට පත්කිරීම.
- 1990 පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාලය ජාතික තරුණ සේවා සභාවට අන්තර්ග්‍රහණය කිරීම.
- 2011 වසරේ ශ්‍රී ලංකා යූත් සංකල්පය ආරම්භ වීම.

1978 වසරේ යෞවන කටයුතු හා රැකී රක්ෂා අමාත්‍යාංශය පිහිටුවීමත් සමඟ සම්මත වූ 1979 අංක 69 දරණ ජාතික තරුණ සේවා පනත යටතේ ජාතික තරුණ සේවා සභාවට පෙරට වඩා පුළුල් බලතල සහිතව තරුණ සංවර්ධන කටයුතු වන නියැලීමට අවකාශය ලැබුණි.

1.1 සංවිධාන ව්‍යුහය



1.2 සභා අධ්‍යක්ෂ මණ්ඩලයේ නාම ලේඛණය

2020.01.01 සිට 2020.08.18 දින දක්වා සභා අධ්‍යක්ෂ මණ්ඩලයේ නාම ලේඛණය

අනු අංකය	නාම ලේඛනය	තනතුර
01.	තෙෂාර ජයසිංහ මහතා	සභාපති / අධ්‍යක්ෂ ජනරාල්
02.	ඩබ්. ඒ. ජේ. සී. වික්‍රමආරච්චි මහත්මිය	සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
03.	ශාලිකා කාරියවසම් මහත්මිය	සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
04.	රංජිත් චන්ද්‍රසේකර මහතා	සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
05.	එම්. එච්. ජී. බණ්ඩාර මහතා	සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
06.	සංජීව රුවන් පතිරණ මහතා	සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
07.	සහන් ද සිල්වා මහතා	සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
08.	එස්. ඒ. අතුල ශාන්ත මහතා	සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
09.	හේමන්ත ශ්‍රීලාල් මහතා	සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
10.	එල්. බී. ඉසංක චතුරංග මහතා	සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
11.	රවි ක්‍රිෂාන් ජයවර්ධන මහතා	සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
12.	ප්‍රභාත් සමරසිංහ මහතා	සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
13.	තිළිණ නිරෝෂන් පෙරේරා මහතා	සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
14.	අසංක එදිරිවීර මහතා	සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
15.	පී. ජී. එස්. පී. විජේවර්ධන මහතා	සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
16.	රෂිත් වික්‍රමසිංහ මහතා	සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
17.	හේමාල් ලසිත් බාලසූරිය මහතා	සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
18.	අජන්තන් ශිවතාස් මහතා	සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
19.	පී. එච්. ඒ. ඩී. මදුෂංක මහතා	සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
20.	චරිතා ප්‍රියදර්ශණි පීරිස් මහත්මිය	සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
21.	ඩී. පී. මහේෂ් ප්‍රමුදිත මහතා	සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
22.	දමිත් රණසිංහ මහතා	සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

2020.08.18 සිට 2020.12.31 දින දක්වා සභා අධ්‍යක්ෂ මණ්ඩලයේ නාම ලේඛණය

අනු අංකය	නාම ලේඛනය	තනතුර
01.	තෙෂාර ජයසිංහ මහතා	සභාපති / අධ්‍යක්ෂ ජනරාල්
02.	ඩබ්. ඒ. ජේ. සී. වික්‍රමආරච්චි මහත්මිය	සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
03.	ශාලිකා කාරියවසම් මහත්මිය (2020.10.12 දින සේවය අවසන් කර ඇත)	සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
04.	විමල් එස්. කේ. ලියනගම මහතා	සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
05.	රංජිත් චන්ද්‍රසේකර මහතා	සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
06.	එම්. එච්. ජී. බණ්ඩාර මහතා	සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
07.	සංජීව රුවන් පතිරණ මහතා	සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
08.	සහන් ද සිල්වා මහතා	සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
09.	එස්. ඒ. අතුල ශාන්ත මහතා	සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
10.	හේමන්ත ශ්‍රීලාල් මහතා	සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
11.	එල්. බී. ඉසංක චතුරංග මහතා	සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
12.	අජන්තන් ශිවතාස් මහතා	සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
13.	පී. එච්. ඒ. ඩී. මදුෂංක මහතා	සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
14.	චරිතා ප්‍රියදර්ශණී පීරිස් මහත්මිය	සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
15.	ඩී. පී. මහේෂ් ප්‍රමුදිත මහතා	සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
16.	දමිත් රණසිංහ මහතා	සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
17.	ප්‍රභාත් සමරසිංහ මහතා (2020.09.11 දින ඉල්ලා අස් වී ඇත.)	සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
18.	ඩී. එච්. එන්. විරසේකර මහත්මිය	සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
19.	ඒ. සුහානි සදීෂා මෙනවිය	සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
20.	ඉරාජ් වීරරත්න මහතා	සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
21.	ටෙහානි ඉමාරා මෙනවිය	සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
22.	එච්. ඩී. එන්. කුමාරි තිලකරත්න මෙනවිය	සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
23.	සුමුදු ඒකනායක මහතා	සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
24.	සු. බණ්ඩාර කරුණාරත්න මහතා	සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

2. විගණක හා කළමනාකරණ කමිටුව - 2020

1.	ඩබ්.ඒ.ජේ.සී වික්‍රමආරච්චි මහත්මිය නියෝජ්‍ය අධ්‍යක්ෂ, ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය, කොළඹ 07.	-	කමිටු සභාපති
2.	එස්.ඒ.අතුල ශාන්ත මහතා සහා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික.	-	කමිටු සාමාජික
3.	දමිත් රණසිංහ මහතා සහා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික.	-	කමිටු සාමාජික
4.	එස්.එන්.හපුආරච්චි මහත්මිය ප්‍රධාන අභ්‍යන්තර විගණක, තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය.	-	නිරීක්ෂක
5.	එච්.කේ.අයි. ගයානි මහත්මිය විගණන අධිකාරී, ජාතික විගණන කාර්යාලය.	-	ආරාධිත
6.	සී.කේ.හේරත් මහත්මිය අභ්‍යන්තර විගණක, ජාතික තරුණ සේවා සභාව.	-	ලේකම්/කැඳවුම්කරු

මූලාශ්‍රය - අභ්‍යන්තර විගණන අංශය, ජාතික තරුණ සේවා සභාව,මහරගම.

3. ජාතික තරුණ සේවා සභාවේ ලැබීම් හා වියදම් පිලිබඳ විස්තරය

ජාතික තරුණ සේවා සභාවේ 2020 වර්ෂයේ ප්‍රතිපාදන ලැබීම්.

(රු. 000)

		2020
භාණ්ඩාගාර		
	පුනරාවර්තන	1211.725
	ප්‍රාග්ධන	528.636
මුළු භාණ්ඩාගාර ප්‍රතිපාදන		**1740.361**
අමාත්‍යාංශ		
	පුනරාවර්තන	140.138
	ප්‍රාග්ධන	23.789
මුළු අමාත්‍යාංශ ප්‍රතිපාදන		**163.927**
පලාත් සභා		
	පුනරාවර්තන	400.00
පලාත් සභා		
විදේශ සංවිධාන		
	පුනරාවර්තන	8.838
	ප්‍රාග්ධන	9.891
වෙනත් බාහිර ආයතන මුළු ලැබීම්		
	අභ්‍යන්තර ආදායම්	151.170

ජාතික තරුණ සේවා සභාවේ 2020 වර්ෂයේ ප්‍රතිපාදන ගෙවීම්.

(රු. 000)

		2020
භාණ්ඩාගාර		
	පුනරාවර්තන	1211.725
	ප්‍රාග්ධන	528.636
මුළු භාණ්ඩාගාර ගෙවීම්		**1740.361**
අමාත්‍යාංශ හා රාජ්‍ය ආයතන වැය		
	පුනරාවර්තන	91.250
	ප්‍රාග්ධන	23.789
මුළු අමාත්‍යාංශ ගෙවීම්		**115.039**
පලාත් සභා		
	පුනරාවර්තන	208.00
මුළු පලාත් සභා ගෙවීම්		
විදේශ සංවිධාන		
	පුනරාවර්තන	8.838
	ප්‍රාග්ධන	12.632
වෙනත් බාහිර ආයතන වැය		
අභ්‍යන්තර ඉපයීම් වැය		
	පුනරාවර්තන	11.770
	සංවර්ධන	96.482
	ප්‍රාග්ධන	1.827

- **විදේශ සංවිධාන ප්‍රාග්ධන ලැබීමට වඩා වියදම වැඩියෙන් සටහන් වී ඇත්තේ ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවට අදාළව අත්තිකාරම් පියවීම ගිණුම්ගත කිරීම හේතුවෙනි.**

ජාතික තරුණ සේවා සභාව වෙත භාණ්ඩාගාරය, අභ්‍යන්තර ඉපයීම් සහ වෙනත් බාහිර ආයතන මඟින් සෘජු හා වක්‍ර ලෙස ප්‍රතිපාදන වලින් දරණ ලද පරිපාලන හා සංවර්ධන වියදම් (රුපියල් මිලියන)

2015– 2020

වර්ෂය	2015	2016	2017	2018	2019	2020
සංවර්ධන	565	768	1212	1115	575	427
පරිපාලන	1014	1014	1075	1124	1309	1223



සංවර්ධන වැඩසටහන් වියදම් සාරාංශය - 2020

අනු අංකය	වැඩසටහන	වෙන්කල මුදල		වැය කළ මුදල (රු.මි.)	
		භාණ්ඩාගාර	අමාත්‍යාංශ	භාණ්ඩාගාර	අමාත්‍යාංශ
1	සෞන්දර්යය කුසලතා සංවර්ධන වැඩසටහන්	47.10	2.56	47.08	2.56
2	ජාත්‍යන්තර තරුණ සබඳතා ක්‍රියාකාරකම්	1.21	6.85	1.20	6.85
3	තරුණ සංවිධාන හා සංවර්ධන වැඩසටහන්	2.42	17.86	2.42	17.86
4	යෞවන නිලිණ අධිකාරිය ක්‍රියාකාරකම්	0.77	-	0.77	-
5	ක්‍රීඩා සංවර්ධන ක්‍රියාකාරකම්	68.55	-	66.42	-
6	කාර්මික හා වෘත්තීය පුහුණු ක්‍රියාකාරකම්	56.70	-	54.51	-
7	තරුණ සමුපකාර හා ව්‍යාපාර සංවර්ධන ක්‍රියාකාරකම්	1.00	-	0.99	-
8	ගොවිපල සංවර්ධන ක්‍රියාකාරකම්	34.94	-	34.95	-
9	මාධ්‍ය ක්‍රියාකරකම්	1.07	-	1.06	-
10	නිස්කෝ වීඩියෝ ක්‍රියාකරකම්	1.20	-	1.19	-
11	සැලසුම් හා සංවර්ධන ක්‍රියාකරකම්	0.92	-	0.92	-
12	තොරතුරු තාක්ෂණ ක්‍රියාකරකම්	0.73	-	0.73	-
13	කාර්ය සාධන හා නිලධාරි ඇගයීම් ක්‍රියාකාරකම්	1.35	-	1.34	-
14	ඉදිකිරීම් ක්‍රියාකාරකම්	171.64	-	171.60	-
15	සැපයුම් ක්‍රියාකාරකම්	101.00	-	98.37	-
16	විශේෂ ව්‍යාපෘති ක්‍රියාකාරකම්	0.45	46.93	0.45	46.93
17	වෘත්තීය මාර්ගෝපදේශන ක්‍රියාකාරකම්	4.55	-	4.508	-
18	ඉඩම්	7.929		6.90	
19	Cross Fit GYM		8.98		8.98
20	Smart Sri Lanka	-	0.65		0.65
	පෙර වර්ෂ බිල්පත් ගැලපීම්	33.30	-	33.21	
	එකතුව	**536.85**	**83.84**	**528.63**	**83.84**

4. සංවර්ධන ක්‍රියාකාරකම් - 2020

4.1 තරුණ සංවිධාන හා සංවර්ධන ක්‍රියාකාරකම්.

ජාතික තරුණ සේවා සභාවේ තරුණ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය තරුණ පෙළ සංවිධාන ගත කිරීම, එසේ සංවිධානගත වූ තරුණ පෙළ සමඟ ඔවුන්ගේ සංවර්ධන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම හරහා වඩා ඵලදායී ලෙස එම සංවර්ධන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිසරය සැකසීම මෙන්ම මෙරට ක්‍රියාත්මක තරුණ සංවිධානයන්ට සිය සේවාවන් වඩාත් කාර්යක්ෂම හා ඵලදායී කරලීම වෙනුවෙන් ජාතික තරුණ සේවා සභාව සතු ශක්තීන් හරහා එම සංවිධානයන් බල ගැන්වීම තරුණ සංවිධාන සංවර්ධන අංශයේ ප්‍රධානතම කාර්ය භාරය වේ.

මෙරට තරුණ ප්‍රජාවේ නායකත්වය හා පෞරුෂ සංවර්ධනය, තරුණ සංවිධානයක් ලෙස යෞවන සමාජ ව්‍යාපාරයේ සංවර්ධනය, ඔවුන් තීරණ ගැනීමේ ක්‍රියාවලියට සක්‍රීයව දායක කරගැනීම, රට තුළ වෙසෙන සියළුම ජාතීන් අතර සමඟිය හා මිත්‍රත්වය වැඩි දියුණු කිරීම වැනි අරමුණු ජයගැනීම පිණිස විවිධ වූ ව්‍යාපෘති වැඩසටහන් හරහා දායකත්වය සැපයීමද මෙම අංශය මඟින් සිදු කරනු ලබයි.

ශ්‍රී ලංකා යෞවන සමාජ සම්මේලනයේ ලියාපදිංචි යෞවන සමාජ පිළිබඳ විස්තර

අනු අංකය	දිස්ත්‍රික්කය	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සංඛ්‍යාව	පිහිටුවීමට නියමිත යෞවන සමාජ සංඛ්‍යාව	මුළු යෞවන සමාජ සංඛ්‍යාව	මුළු යෞවන සමාජ සාමාජික සංඛ්‍යාව	පිහිටුවා ඇති යෞවන සමාජ ප්‍රමාණය % ලෙස
01.	කොළඹ	**13**	**557**	**152**	**3086**	**27.28%**
02.	ගම්පහ	**13**	**1177**	**39**	**959**	**3.31%**
03.	කළුතර	**14**	**762**	**73**	**1523**	**9.58%**
04.	ගාල්ල	**19**	**896**	**171**	**4045**	**19.08%**
05.	මාතර	**16**	**650**	**163**	**3067**	**25.07%**
06.	හම්බන්තොට	**12**	**576**	**205**	**4976**	**35.59%**
07.	මහනුවර	**20**	**1188**	**58**	**1368**	**4.88%**
08.	මාතලේ	**11**	**545**	**172**	**3506**	**31.55%**
09.	නුවරඑළිය	**05**	**491**	**124**	**3548**	**25.25%**
10.	මොණරාගල	**11**	**319**	**68**	**1801**	**21.31%**
11.	බදුල්ල	**15**	**567**	**134**	**3680**	**23.63%**
12.	කෑගල්ල	**11**	**573**	**37**	**815**	**6.45%**
13.	රත්නපුර	**17**	**575**	**278**	**6864**	**48.34%**
14.	කුරුණෑගල	**30**	**1610**	**445**	**6855**	**27.63%**
15.	පුත්තලම	**16**	**548**	**113**	**2412**	**20.62%**
16.	අනුරාධපුරය	**22**	**694**	**229**	**5298**	**32.99%**

17.	**පොලොන්නරුව**	**07**	**295**	**101**	**2115**	**34.23%**
18.	**ත්‍රිකුණාමලය**	**11**	**230**	**167**	**5438**	**72.6%**
19.	**මඩකලපුව**	**14**	**348**	**250**	**10724**	**71.83%**
20.	**අම්පාර**	**20**	**503**	**236**	**8931**	**46.91%**
21.	**වව්නියාව**	**04**	**102**	**69**	**2130**	**67.64%**
22.	**මන්නාරම**	**05**	**153**	**101**	**3995**	**66.01%**
23.	**කිලිනොච්චි**	**04**	**95**	**78**	**2994**	**82.1%**
24.	**මුලතිව්**	**06**	**136**	**57**	**1515**	**41.91%**
25.	**යාපනය**	**15**	**435**	**333**	**7055**	**76.55%**
එකතුව		**331**	**14025**	**3853**	**98700**	**27.47%**

කොවිඩ් - 19 ව්‍යසනකාරී තත්වය හමුවේ කරන ලද වැඩසටහනක් ලෙස Start up Sri Lanka වැඩසටහන තරුණ තරුණියන් අතර ක්‍රියාත්මක කරන ලදි. ස්වශක්තියෙන් නැගී සිටීමට වෙර දරණ තරුණ ව්‍යවසායකයින්ගේ ජීවන තත්වය නගා සිටුවීම හා ඔවුන් ස්වයං රැකියා සඳහා යොමු කරලීමටත් මූල්‍ය පහසුකම් ලබා දීමටත් සහය වීම මඟින් දිගුකාලීනව තාරුණ්‍යයේ ආර්ථිකය සවිබල ගැන්වීම මෙමඟින් සිදු කරන ලදි. නව නිෂ්පාදන ක්ෂේත්‍ර 09ක් (කෘෂි තාක්ෂණික උපකරණ, කෘෂිකර්මාන්තය මුල් කරගත් අගය එකතු කළ නිෂ්පාදන, සීසෑයෙන් අලෙවි වන පාරිභෝගික භාණ්ඩ, විද්‍යුත් උපකරණ, රොබෝ තාක්ෂණය හා කෘතිම බුද්ධිය, අන්තර්ජාලික කරුණු, ජනතා කේන්ද්‍රීය තොරතුරු තාක්ෂණ සේවා, ඇඟලුම් ක්ෂේත්‍ර) තුළ තරුණ තරුණියන් 1,112ක ප්‍රමාණයක් නව නිෂ්පාදන සිදු කිරීමට පෙළඹවීම. ක්ෂේත්‍ර 09න් ජයග්‍රාහී තරුණ තරුණියන් 27 දෙනෙකු තෝරා ඔවුන් සඳහා වෙළඳපොළ අවස්ථා හඳුන්වා දීම මෙමඟින් සිදු කරන ලදි.





4.2 වෘත්තීය මාර්ගෝපදේශන හා උපදේශන ක්‍රියාකාරකම්.

ජාතික තරුණ සේවා සභාවේ වෘත්තීය මාර්ගෝපදේශන හා උපදේශණ අංශය ප්‍රධාන වශයෙන් කොටස් දෙකකින් සමන්විතය.එයින් වෘත්තීය මාර්ගෝපදේශන කොටස යටතේ මුළු දිවයිනම ආවරණය වන පරිදි දිස්ත්‍රික් මට්ටමින් වෘත්තීය මාර්ගෝපදේශන මධ්‍යස්ථාන 25 ක් ක්‍රියාත්මක වේ. වැඩලෝකයට පිවිසීමට සූදානම් වීම, එහි නව ප්‍රවණතා හඳුනාගැනීම, වැඩලෝකයට පිවිසි තරුණ ප්‍රජාවට වෘත්තීය මග සැලසුම් කර ගැනීමට සහයවීම ආදී අරමුණු ප්‍රධානකොටගෙන වැඩලෝකය හා තරුණ ප්‍රජාව අතරවූ සම්බන්ධීකරණ මධ්‍යස්ථානයක් ලෙස මෙම වෘත්තීය මාර්ගෝපදේශන මධ්‍යස්ථාන ක්‍රියාත්මක වේ.

එහි දෙවන කොටස වන යොවුන් මිතුරෝ මනෝවිද්‍යාත්මක උපදේශන මධ්‍යස්ථාන පවත්වාගෙන යාමයි. සරල මානසික පීඩාවක සිට විවිධ වූ මානසික රෝගී තත්වයන් සඳහා උපදේශනය ලබාදෙන අතර තරුණ

ප්‍රජාවගේ මානසික සමබරතාවය හා සුවතාවය ඉලක්ක කරගත් වැඩසටහනකි. ලංකාවේ පළාත් ආශ්‍රිතව එවැනි මනෝවිද්‍යාත්මක උපදේශන මධ්‍යස්ථාන 07 ක් ක්‍රියාත්මක වේ.

2020 වර්ෂයේ ක්‍රියාත්මක කල වැඩසටහන්

අනු අංකය	වැඩසටහන	යෞවන සමාජ ප්‍රමාණය	සහභාගීත්වය
1.	වෘත්තීය මාර්ගෝපදේශන මධ්‍යස්ථාන දිස්ත්‍රික් තුළ පවත්වාගෙන යාම.	71	26191
2.	වෘත්තීය පුහුණුකරුවන් වෘත්තීය වැඩලෝකයට හඳුන්වා දීම.	18	1151
3.	වෘත්තීය පුහුණුව සඳහා රැකියාගත පුහුණුව.	59	101
4.	උපදේශන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.	15	560
5.	උපදේශන වැඩසටහන්	10	
6.	වෘත්තීය මාර්ගෝපදේශන මධ්‍යස්ථාන පවත්වාගෙන යාම.	25	
		198	28003

4.3 ක්‍රීඩා සංවර්ධන ක්‍රියාකාරකම්

ජාතික තරුණ සේවා සභාවේ වාර්ෂික සංවර්ධන වැඩසටහන් අතුරින් ක්‍රීඩා සංවර්ධන වැඩසටහන් තාරුණ්‍යට වඩාත් ඵලදායි ලෙස 2020 වසරේදී ක්‍රියාත්මක කොට ඇත. සමස්ථ ශ්‍රී ලාංකේය යෞවන සමාජ සාමාජික සාමාජිකාවන්ගේ ක්‍රීඩා කුසලතාවන් ග්‍රාමීය මට්ටමේ සිට ජාතික මට්ටම දක්වා ඔසවා තබාගැනීම සඳහා වසර පුරා විවිධ ක්‍රීඩා වැඩසටහන් ක්‍රියාත්මක කරන ලද අතර, ඒ තුළින් ඔවුන් කායික හා මානසික වශයෙන් සෞඛ්‍ය සම්පන්න ශක්තිමත් තාරුණ්‍යයක් බවට පත්කොට ඔවුන් තුළ ජනිත වන තාරුණ්‍යයේ ජවය ජාතික සංවර්ධන ප්‍රවාහය වෙත මුදාහැරීමට හැකිවීම අප ලද සාර්ථකත්වය වේ.

නීරෝගිමත් ශ්‍රී ලාංකේය තාරුණ්‍යයක් බිහිකිරීමේ පෙරගමන්කරු ලෙස ජාතික තරුණ සේවා සභාව වෙත සභාය වීම ප්‍රධාන අරමුණු කොටගත් ක්‍රීඩා සංවර්ධන අංශය 2020 වර්ෂයේදී පහත ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදී.

01. ජාතික යෞවන ක්‍රීඩා උළෙල

2020 වර්ෂයේදී 31 වැනි වතාවටත් යෞවන සමාජ සාමාජික සමාජිකාවන්ගේ කුසලතාවයන් නංවාලීමේ අරමුණු පෙරදැරිව තරුණ තරුණියන් 1194 කගේ සහභාගීත්වයෙන් ක්‍රියාත්මක කරන ලදී. තවද 32 වැනි යෞවන ක්‍රීඩා උළෙලේ ප්‍රාදේශීය මට්ටමේ තරඟ කොට්ඨාස 331 ක තරුණ තරුණියන් 148,950 සහභාගීත්වයෙන් ද ජාතික මට්ටමේ එක් කණ්ඩායම් තරඟයක්ද (සහභාගීත්වය 48) පවත්වන ලදි.



02. තරුණ සේවා විශේෂ ක්‍රීඩා සංචිත වැඩසටහන - හෙයියන්තුඩුව පුහුණු මධ්‍යස්ථානය

වොලිබෝල් හා කබඩි ක්‍රීඩාව වෙනුවෙන් ජාතික තලයට කුසලතා පිරිපුන් ක්‍රීඩක ක්‍රීඩිකාවන් හා උපදේශකවරුන් පුහුණු කිරීමේ අරමුණින් යුතුව හෙයියන්තුඩුව පුහුණු මධ්‍යස්ථානය කේන්ද්‍ර

කොට ගනිමින් උක්ත ක්‍රීඩා සංචිත ක්‍රියාත්මක වන අතර, එහිදී කණ්ඩායම් 03ක් යටගේ තරුණ තරුණියන් 30ක් පුහුණු කරන ලදි.

ක්‍රීඩා පුහුණුව අවසන් කරනු ලැබූ තරුණ පිරිසද මේ වන විට ත්‍රිවිධ හමුදාව, වරාය අධිකාරිය, විදුලිබල මණ්ඩලය වැනි ආයතන සඳහා රැකියාගත වී ඇත. ඒ අනුව සංචිත වල පුහුණුව ලැබූ තරුණ හැකියා පෙන්නුම් කළ සියලු තරුණ පිරිස මේ වන විට රටේ ජාතික ආර්ථිකයට දායක වී ඇත.

04. තරුණ සේවා ක්‍රීඩා සමාජ වැඩසටහන

ප්‍රධාන කාර්යාලීය තරුණ මධ්‍යස්ථානය කේන්ද්‍ර කොට ගනිමින් ක්‍රීඩා ඉසව් 16ක් පුහුණු කිරීමේ අරමුණු කොට ගෙන අර්ධ කාලීන වැඩසටහනක් ලෙස මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ. (තරුණ තරුණියන් 63ක් පුහුණු කරන ලදි)



4.4 සෞන්දර්ය කුසලතා සංවර්ධන ක්‍රියාකාරකම්

01. ජාතික යෞවන සම්මාන තරගාවලිය සහ උළෙල

ශ්‍රී ලාංකීය කලාකෙත පෝෂණය කිරීම සඳහා අංකුර කලාකරුවන් හෙවත් කලාකෙතට අත්පොත් තබන නව යොවුන් නිර්මාණකරුවන් හඳුනා ගැනීම, නිර්මාණකරණයට සහය ලබා දීම හා ඒවා ඇගයීමට ලක් කිරීම ඉතා වැදගත් වේ. මේ තුලින් බිහි වන නව යොවුන් නිර්මාණකරුවන් අනාගත කලා ක්ෂේත්‍රය පෝෂණය කිරීම සඳහා සුවිශේෂී මෙහෙවරක් ඉටු කරනු ලබන අතර එය ශ්‍රී ලාංකීය කලාකෙත සශ්‍රීය කිරීම සඳහා මහත් පිටුවහලක් වේ. මේ සඳහා ග්‍රාමීය මට්ටමේ නව යොවුන් නිර්මාණකරුවන් හඳුනා ගැනීම හා ජාතික මට්ටමට හඳුන්වා දීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් සකස් කිරීම ජාතික තරුණ සේවා සභාවේ කාර්යභාරයක් වනු ඇත. මේ සඳහා ජාතික තරුණ සේවා සභාව ජාතික යෞවන සම්මාන නමින් නිර්මාණකරුවන් ඇගයීමට ලක් කර සම්මාන පිරි නැමීමේ ජාතික වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබන අතර එය දිස්ත්‍රික් පළාත් හා ජාතික ලෙස අදියර 03 ක් ක්‍රියාත්මක වේ.කරනු ලබන අතර එය දිස්ත්‍රික් පළාත් හා ජාතික ලෙස අදියර 03 ක් ක්‍රියාත්මක වේ. වසර තුළ දිස්ත්‍රික් 24 තුළ තරුණ තරුණියන් 3418 සහභාගීත්වයෙන් දිස්ත්‍රික් මට්ටමේ ද පළාත් 08ක 790ක තරුණ සහභාගීත්වයෙන් තරහාවලීන් පැවැත්වීමට හැකි විය. යෞවන සම්මාන උළෙලට සමගාමීව දිස්ත්‍රික් 14ක තරුණ තරුණියන් 370කගේ සහභාගීත්වයෙන් ප්‍රවීණයන්ගේ මූලිකත්වයෙන් නාට්‍ය සංචිත පැවැත්වීමට කටයුතු කරන ලදි. තවද පළාත් මට්ටමේ නාට්‍ය තරහාවලීන් තරුණ තරුණියන් 1460කගේ සහභාගීත්වයෙන් සෑම පළාතකම පැවැත්වීමට හැකි වීම කොවිඩ් හමුවේ ලද ජයග්‍රාහණයකි.

02. සෞන්දර්ය නිකේතන සංවර්ධනය

රටක යහපැවැත්ම සඳහා සෞන්දර්ය විෂයට අදාළ ක්ෂේත්‍රවල ව්‍යාපෘති කිරීම ඉතා වැදගත් වේ. ජාතික තරුණ සේවා සභාව රාජ්‍ය ආයතනයක් ලෙස බෙල්වුඩ් සෞන්දර්ය නිකේතනය, එරමිණියාය සෞන්දර්ය නිකේතනය හා මහරගම සෞන්දර්ය නිකේතනය තුල සංගීතය හා නැටුම් යන අංශ ආවරණය වන ආකාරයට ඩිප්ලෝමා පාඨමාලා පවත්වනු ලැබේ.



වසර 03 ක විධිමත් ඩිප්ලෝමා පාඨමාලාවක් ලෙස න්‍යායික හා ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇතුලත් පුහුණුවක් ලබාදීම තුලින් අභ්‍යාසලාභීන්ගේ සෞන්දර්යාත්මක දැනුම වර්ධනය කිරීම මෙම



ව්‍යාපෘතියෙන් අපේක්ෂා කෙරේ. ඉහත පාඨමාලාවන් සඳහා NVQ Level 6 මට්ටම ලබා ගැනීමටද මේ වන විට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. කොවිඩ් වසංගත තත්වය හමුවේ තරුණ අභ්‍යාසලාභීන් 194කගේ සහභාගීත්වයෙන් ඉතාමත් සාර්ථකව පුහුණු පාඨමාලා අවසන් කිරීමට හැකියාව ලැබුණි.

සෞන්දර්ය නිකේතනයන් හා තරුණ අභ්‍යාසලාභීන් 194ට අමතරව විශේෂ නර්තන හා සංගීත කණ්ඩායමේ තරුණ තරුණියන් 58ක් නිරන්තර පුහුණුවීම් ලබා සංගීත ප්‍රසංග 10කටත්, නාට්‍ය ප්‍රසංග 16කටත් සහභාගී වීමේ වරම් හිමි කරගෙන ඇත.

03. ජාතික සංස්කෘතික වැඩසටහන්



ශ්‍රී ලංකාව විවිධ ජාතීන් ජීවත් වන බහු ආගමික හා බහු වාර්ගික රටකි. මෙම විවිධ ජාතීන්ගේ සංස්කෘතික සාර්ධර්මද විවිධ වේ. ජාතීන්ගෙන් මෙන්ම ආගමික හා සංස්කෘතික සාරධර්ම වලින් ද විවිධ වූ මෙරට ඇත අතීතයේ සිටම සහයෝගයෙන් සංහිදියාවෙන් එක්ව ගත කිරීමට මෙම සියලු ජාතීන් උනන්දුවක් දක්වති. මෙම තත්වය පරම්පරාවෙන් පරම්පරාවට රැගෙන යාම ඉතා වැදගත් වේ. මේ සඳහා තරුණ තරුණියන්ගේ සහභාගිත්වයෙන් විවිධත්වයෙන් යුතු සංස්කෘතික වැඩසටහන් සංවිධානය කිරීම සිදු කෙරේ.

04. අමාවක පහන්වැස්ස

අමාවක පොහෝ දිනය වඩාත්ම අඳුර පැතිරුණු දිනය වේ. මෙම දිනයේදී තරුණ වියේදීම ජීවිතය පූජා කළ රණවිරුවන්, කැරළි කෝලාහල හා කොරෝනා වසංගත ආදියෙන් මිය ගිය තරුණ තරුණියන්ගේ ජීවිතයන් මෙන්ම අකාලයේ මිය ගිය ජනතාවට ආලෝකය උදා කිරීමේ ප්‍රාර්ථනයෙන් පහන් දල්වා ආශිර්වාද කිරීම හා ආශිර්වාද කිරීම හා ආගමික වතාවත් පැවැත්වීම මෙමඟින් සිදුවේ. දිස්ත්‍රික් 05ක තරුණ තරුණියන් 1665කගේ සහභාගීත්වයෙන් මෙම වැඩසටහනද ක්‍රියාත්මක විය.

4.5 කාර්මික හා වෘත්තීය පුහුණු ක්‍රියාකාරකම්

ජාතික තරුණ සේවා සභාව මඟින් පවත්වාගෙන යනු ලබන සියළුම වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන තත්ව කළමණාකරණ සහතිකය ලත් පුහුණු මධ්‍යස්ථාන බවට පරිවර්තනය කරමින්, දේශීය හා විදේශීය වෙළෙඳපොළ අවශ්‍යතාවයට ගැළපෙන නිපුනතා සම්මතයන්ට අනුව වෘත්තීය පුහුණුව ලබා දෙමින්, ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකය ලත් පුහුණු ශ්‍රමිකයන් බිහි කිරීම.

රටේ පැවැති කොවිඩ් - 19 තත්වය හමුවේ මාර්ගස්ථ ක්‍රමය උපයෝගී කරගනිමින් තරුණ තරුණියන්ට වෘත්තීය පාඨමාලා සාර්ථකව ක්‍රියාත්මක කරනු ලැබීය.

පුහුණු මධ්‍යස්ථාන තොරතුරු

- මධ්‍යස්ථාන ප්‍රමාණය – 54
- පාඨමාලා ප්‍රමාණය – 110 (Full Time- 38 , Six Month – 72)
- අභ්‍යාසලාභීන් ප්‍රමාණය - 16,569 (වාර්ෂිකව)
- NVQ මට්ටම් - NVQ 3,4,5
- පාඨමාලා කාලය - මාස 06, අවුරුදු 01

අභ්‍යාසලාභීන් බඳවා ගැනීම - 2020 (පළාත් මට්ටමින් - NVQ පාඨමාලා සඳහා)

පළාත	පුහුණු පාඨමාලා ප්‍රමාණය	බඳවා ගැනීම්	සම්පූර්ණ කළ ප්‍රමාණය
බස්නාහිර	66	1706	1566
දකුණු	32	632	517
සබරගමුව	12	250	198
ඌව	10	180	138
වයඹ	19	556	391
මධ්‍යම	30	763	640
උතුරු මැද	19	478	392
නැගෙනහිර	26	602	433
වන්නි	07	134	94
උතුරු	01	31	30
එකතුව	222	5332	4399

මෙම සියළුම පාඨමාලා NVQ මට්ටම් I,II,III,IV ලෙස වෙන් වෙන් වශයෙන් පවතී.

4.6 ජාත්‍යන්තර තරුණ සබඳතා ක්‍රියාකාරකම්

ශ්‍රී ලාංකීය තාරුණ්‍යයට ගෝලීය වශයෙන් විවිධ රටවල් වල අත්දැකීම් , දැනුම ලබා දෙමින් විදේශීය වෙළෙඳපොළට ගැලපෙන තරුණ තරුණියන් නිර්මාණය කර ඔවුන්ගේ ආර්ථිකය සවිබල ගැන්වීම. තවද භාෂා කුසලතා, නායකත්ව කුසලතා, කණ්ඩායම් ක්‍රියාකාරකම් සංවර්ධන කිරීම තුළින් නව සහශ්‍රයට ගැලපෙන තාක්ෂණික දැනුම ලබා දෙමින් ආකල්ප සංවර්ධනය හා තරුණයා ජාත්‍යන්තරයට රැගෙන යාමට අවස්ථාව ලබා දීම මෙම අංශය මඟින් සිදුවේ.



ජාත්‍යන්තර තරුණ සබඳතා ක්‍රියාකාරකම්

වැඩසටහන	වැඩසටහන් ප්‍රමාණය	සහභාගීත්වය
ශ්‍රී ලංකා තරුණ තරුණියන් කලාපීය වශයෙන් ක්‍රියාකාරීව දායක වේ (ජාත්‍යන්තර තරුණ සංසද / වැඩමුළු / සම්මන්ත්‍රණ)	02	03
ජගත් තරුණ නෞකා වැඩසටහන	01	08
නිළධාරීන් සඳහා විදෙස් පුහුණුව ලබා දීමේ (වැඩමුළු/ සමුළු/සම්මන්ත්‍රණ) - ඉන්දියාව	01	01





4.7 නිස්කොම විඩියෝ ක්‍රියාකාරම්



තරගකාරී වාණිජ ලෝකයේ නොයෙකුත් අපහසුකම් නිසා සිය දක්ෂතාවන්ගෙන් ප්‍රයෝජන ගැනීමට ශ්‍රී ලාංකේය තාරුණ්‍යයට නොහැකි පරිසරයක් ගොඩනැගී තිබුණි. ඊට රාජ්‍ය ආයතනයක මැදිහත් වීම අවශ්‍යව තිබුණි. ඒ පසුබිම මත ජාතික තරුණ සේවා සභාව විසින් නිස්කොම වීඩියෝ අංශය ආරම්භ කරන ලදි.

- ජාතික තරුණ සේවා සභාවේ අරමුණු හා පරමාර්ථ සාක්ෂාත් කරගැනීම උදෙසා ජාතික තරුණ සේවා සභාවේ දැක්ම හා අරමුණු වලට අනුගතව නිස්කොම වීඩියෝ අංශයේ දැක්මට අනුකූලව ශ්‍රී ලාංකීය තාරුණ්‍යයේ දියුණුව උදෙසා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- එම වැඩසටහන් මගින් අදාල දර්ශන භාවිතයට ගනිමින් රූපවාහිනී හා ජනමාධ්‍ය ක්ෂේත්‍රය පිළිබඳව තාරුණ්‍යය දැනුවත් කිරීම
- තරුණ සංවර්ධනය සඳහා ඉටු කෙරෙන කාර්යයන් විඩියෝ ගත කිරීම හා සංරක්ෂණය කිරීම
- හැකියාවන් සහිත තරුණ තරුණියන් ජාතික තලයට හඳුන්වා දීම උදෙසා වූ වැඩසටහන් රූපවාහිනී මාධ්‍යයෙන් විකාශන කටයුතු සඳහා යොමු කිරීම

1.රූපවාහිනී ප්‍රවෘත්ති ආවරණය, වැඩසටහන් නිෂ්පාදනය හා සංස්කරණය

ජාතික තරුණ සේවා සභාව මගින් ක්‍රියාත්මක කෙරෙන සියලුම වැඩසටහන් ජනගත කිරීම සඳහා කටයුතු කරන ලදි. මේ සඳහා රූපවාහිනී මාධ්‍ය හා සමාජ මාධ්‍ය ශාලා **Facebook** උපයෝගී කර ගන්නා ලදි.



* සමාජ දුරස්ථභාවය තබාගනිමින් සිනමාව කෙරෙහි තාරුණ්‍යය් හැකියාවන් ඔපනැංවීම හා ඔවුන් සිනමා කර්මාන්තය කෙරෙහි පිවිසීමට අත්වැලක් ලබා දීම සඳහා මාර්ගස්ථ ක්‍රමයෙන් තරුණ තරුණියන් 170ක් පමණ කෙටි චිත්‍රපට සඳහා අයදුම්පත් හා නිර්මාණ ඉදිරිපත් කරන ලදි. මේ තුළින් කෙටි චිත්‍රපට අංශයෙන් නිර්මාණ 13 හා වාර්තා චිත්‍රපට අංශයෙන් නිර්මාණ 08 මූලික වටයෙන් තෝරා ගන්නා ලදි. ඒ අතුරින් අවසාන වටය සඳහා කෙටි චිත්‍රපට 10 හා වාර්තා චිත්‍රපට 08 තෝරා ගන්නා ලදි.

4.8 ගොවිපළ සංවර්ධන ක්‍රියාකාරකම්



කොවිඩ් - 19 ගෝලීය වසංගත තත්වය හේතුවෙන් විවිධ අභියෝගයන්ට මුහුණ දෙමින් තම යුතුකම් හා වගකීම් ඉටුකරමින් රටේ අභිවෘද්ධියට දායක වීම සඳහා තරුණ පිරිස කෘෂිකර්මාන්තයට යොමු කරවීම. තවද විවිධ සංස්කෘතික, ක්‍රීඩා වැනි බාහිර ක්‍රියාකාරකම් සඳහා යොමුවීම කොවිඩ් - 19 ව්‍යසන තත්වය හමුවේ අපහසු වූ බැවින් තරුණයන්ගේ මානසික සෞඛ්‍ය හා විවේක කාලය ඵලදායී ලෙස යොදා ගැනීමට කෘෂි නිෂ්පාදන කෙරෙහි තරුණ දායකත්වය ලබා දීම. අතහැර දමා තිබූ ජාතික තරුණ දේවා සභාව සතු ගොවිපලවල් නැවත වගා කිරීම සඳහා යෙදවීමට කටයුතු කරන ලදි. මේ අතර සුළු හා මධ්‍යම ප්‍රමාණයේ ගොවිපලවල් 19ක් ක්‍රියාත්මක කරන ලදි. NVQ – 4 මට්ටමේ කෘෂි පාඨමාලා ගොවිපළවල් 10ක් කේන්ද්‍ර කරගෙන සිදු කළ අතර 270ක තරුණ සහභාගීත්වයක්ද විය.



තරුණ ප්‍රජාව වගා කටයුතු සඳහා නිරත කිරීම. මෙහි දිවයින පුරා තරුණයන් 34,524 ගෙවතු වගාව සඳහා යොමු වූ අතර, ඔවුන්ගෙන් දිස්ත්‍රික්ක ජයග්‍රහණ 1,2,3 හා ජාතික මට්ටමේ ජයග්‍රහණ 1,2,3 තෝරා ඇගයීමකට ද ලක් කිරීම. මෙම ජයග්‍රාහී ගෙවතු වගා සිදු කරනු ලැබූ තරුණයන් යටතේ වක්‍රාකාරව තවත් රැකියා අවස්ථා සහිත තරුණයන් 200ට ආසන්න ප්‍රමාණයක් නිර්මාණය වී දිස්ත්‍රික්, පළාත, මධ්‍යස්ථාන ආශ්‍රිත ගෙවතු ආරම්භ කිරීම.තරුණ පිරිස කෘෂිකර්මාන්තය සඳහා උනන්දු ඇති පිරිසක් කරලීම සඳහා පවුල සතු සීමිත සම්පත් ආධාරයෙන් පවුලේ ආර්ථිකය ශක්තිමත් කිරීමට තරුණයන් පෙළගැස්වීම හා ඒ තුළින් ජාතික අවශ්‍යතාවයට මැදිහත් කරලීම.

4.9 සැළසුම්, ප්‍රගති සමාලෝචන හා නිළධාරී පුහුණු අංශය

සෞභාග්‍යය දැක්ම ජාතික ප්‍රතිපත්තියට අනුකූලව, තිරසාර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම තුළින් රටේ තාරුණ්‍යය අවශ්‍යතාවයට අනුව ආයතනික කටයුතු විධිමත්ව සැළසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සඳහා මග පෙන්වීම තුළින් ආයතනික කාර්යසාධනය විධිමත්ව ඉහළ නැංවීම.



සංයුක්ත සැළැස්ම සකස් කිරීම, වාර්ෂික සංවර්ධන සැළැස්ම , වාර්ෂික ක්‍රියාත්මක සැළැස්ම හා දිස්ත්‍රික් සැළැස්ම සකස් කිරීම ප්‍රධාන වශයෙන් සිදු වේ .පුස්තකාල සංවර්ධනය කටයුතු මෙන්ම ප්‍රගතිය (සති,මාසික හා කාර්තු) මැන බැලිමද සිදු වේ. තවද ප්‍රගතිය මැන බැලීමෙන් අනතුරුව ආයතනික කාර්යසාධනය හා වාර්ෂික වාර්තා සකස් කිරීම.

එමෙන්ම ආයතනික නිළධාරී කාර්ය සාධනය ඉහළ නැංවීම උදෙසා ඔවුන්ගේ අවශ්‍යතාවය මත පුහුණු වැඩසටහන් 07ක් සමාජ දුරස්ථභාවය තබා ගනිමින් 450කගේ සහභාගීත්වයෙන් ක්‍රියාත්මක කිරීමට හැකි විම.



4.10 පර්යේෂණ, කාර්යසාධන ඇගයීම් හා සුභසාධනය

මේහි දී ප්‍රධාන වැඩසටහන් 02ක් ක්‍රියාත්මක විය. එනම්,

- <u>කාර්යසාධන ඇගයීම් වැඩසටහන</u>

කාර්යසාධන ඇගයීම් වැඩසටහන මඟින් ජාතික තරුණ සේවා සභාවේ සේවයේ නියුතු නිලධාරීන්ගේ කාර්යසාධනය මැන බැලීම හා ඔවුන්ගේ කාර්යසාධනය ඉහළ නැංවීමට අවශ්‍ය කටයුතු සිදු කෙරේ. ඉහළ කාර්යසාධනයක් සහිත නිලධාරීන් හට තිළිණ, සහතිකපත් ලබාදීම මෙන්ම කාර්යසාධනය අවම මට්ටමක පවතින නිලධාරීන් හට ප්‍රශස්ථ මට්ටමකට ඔවුන්ගේ දැනුම, කුසලතා හා ආකල්ප ලඟා කර ගැනීමට අවශ්‍ය කටයුතු කාර්යසාධන ඇගයීම් වැඩසටහන හරහා සිදු කෙරේ.

මෙහිදී ශ්‍රේණි 05ක් සඳහා ඇගයීම් වැඩසටහන ක්‍රියාත්මක කිරීමට හැකි විය.

- <u>සුභසාධන ක්‍රියාවලිය</u>

කාර්යඵල සාධනය උදෙසා සේවක තෘප්තිය ඇති කරලීම වැදගත්ම සාධකයකි. සේවකයින් දිරිමත් කිරීමේ අභිප්‍රේරණ කාර්යයන් මෙන්ම, රාජකාරි කාලය තුළ කාර්ය මණ්ඩලයේ සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයන්ගේ මානසික තෘප්තිය ඇති කරලීම හා අවධානම් දැරීම ආයතනයේ යුතුකමක් වශයෙන් සුභසාධනය වැදගත් වේ. ඊට අදාළව, කාර්ය මණ්ඩලයේ සෞඛ්‍ය හා නිරෝගීතාවය සුරක්ෂිත කිරීම

හා අවධානම් දැරීම තුළින් කාර්යක්ෂමතාවය අඛණ්ඩව පවත්වාගැනීම, ඒ සඳහා, අග්‍රහාර රන්රක්ෂණ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම.

ආයතනයේ මානව සම්පත සඵලදායී හා කාර්යක්ෂම ලෙස උපයෝජනයේදී සමස්ථ කාර්ය මණ්ඩලයේ සුභසාධනය උදෙසා වැඩසටහන් සංවිධානය හා සිරස් - තිරස් හා විකර්ණ සම්බන්ධතා පවත්වා ගැනීම තුළින් ආයතනයේ කළමනාකාරීත්වය සමඟ කාර්ය මණ්ඩලයේ විධිමත් අන්තර් පුද්ගල සන්නිවේදන සම්බන්ධතාවය පවත්වා ගැනීමට කටයුතු කිරීම.

4.11 මාධ්‍ය අංශය

ජාතික තරුණ සේවා සභාව මඟින් ක්‍රියාත්මක කරනු ලබන සියලුම තරුණ සංවර්ධන වැඩසටහන් පිළිබඳ පුවත්පත්, ගුවන් විදුලි, රූපවාහිනී වන මාධ්‍ය මඟින් පුලුල් ප්‍රචාරයක් ලබා දීම. ප්‍රදර්ශන කුටි නිර්මාණය කිරීම ජාතික තරුණ සේවා සභාව මඟින් සියලුම තරුණ සංවර්ධන වැඩසටහන් තරුණ තරුණියන් දැනුම්වත් වන අයුරින් අත් පත්‍රිකා, පෝස්ටර්, කටවුට් ඇතුලු සියලුම මාධ්‍ය කලා නිර්මාණ සිදු කිරීම. ජාතික තරුණ සේවා සභාව මඟින් ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සංවර්ධනාත්මක වැඩසටහන් පිළිබඳ සමස්ථ තරුණ ප්‍රජාව දැනුම්වත් කිරීම, දිස්ත්‍රික් මාධ්‍ය සාකච්ඡා මඟින් දිස්ත්‍රික් හා පළාත් මට්ටමින් සිදු කරනු ලබන තරුණ සංවර්ධන වැඩසටහන් පිළිබඳ මාධ්‍ය මඟින් පුලුල් ප්‍රචාරයක් ලබා දීම.

4.12 තොරතුරු තාක්ෂණ ක්‍රියාකාරකම්.

ජාතික තරුණ සේවා සභාවේ තොරතුරු තාක්ෂණික සංවර්ධන අංශය මගින් ජාතික තරුණ සේවා සභාවේ සියලුම තොරතුරු තාක්ෂණික අවශ්‍යතා සපුරාලීම වෙනුවෙන් පිහිටුවා ඇත. එම අවශ්‍යතා අතර,

01. ජාතික තරුණ සේවා සභාවේ ක්‍රියාකාරකම් නවීන තාක්ෂණය භාවිතා කර ඉටු කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික පහසුකම් සංවර්ධනය කිරීම.
02. කාර්යක්ෂම සන්නිවේදන ක්‍රමවේදයක් සැකසීම මගින් ශ්‍රී ලාංකීය තාරුණ්‍ය වෙත තොරතුරු සන්නිවේදනය කාර්යක්ෂම කිරීම.
03. ජාතික තරුණ සේවා සභාවේ නිල වෙබ් අඩවිය සංවර්ධනය හා යාවත්කාලීන කිරීම තුලින් තොරතුරු ඉක්මනින් ලබා දීම.
04. ජාතික තරුණ සේවා සභාවේ පවතින පරිගණක ජාල පද්ධතිය නඩත්තු කිරීම හා පවත්වාගෙන යාම හා යාවත්කාලීන කිරීම.
05. ජාතික තරුණ සේවා සභාවේ යෞවන සමාජ /පුහුණු මධ්‍යස්ථාන තරුණ තරුණියන්ගේ තොරතුරු තාක්ෂණ භාවිතය හා ආරක්ෂාව පිලිබඳව දැනුවත් කිරීමේ වැඩමුළු සංවිධානය හා ක්‍රියාත්මක කිරීම.

2020 වසර තුළ පැවැති කොවිඩ් - 19 තත්වය හමුවේ ආයතනයේ තොරතුරු තාක්ෂණය කාර්යක්ෂමව හා විධිමත්ව සකස් කර අවශ්‍යතාවයන් මාර්ගස්ථ ක්‍රමය මඟින් සපුරාලීමට හැකි වීම. මේ අතර තරුණ සම්බන්ධතා සංවර්ධනය උදෙසා කාර්යක්ෂම සන්නිවේදන ජාල පද්ධතියක් සංවර්ධනය සඳහා යටිතල පහසුකම් ඇති කිරීම ප්‍රමුඛ වේ.

- මෙහි පළමු අදියර ලෙස ජාතික තරුණ සේවා සභාවේ ආයතනය සතු වාහන මාර්ගගත ක්‍රමය ඔස්සේ පහසුවෙන් වෙන් කරවා ගත හැකි වන පරිදි තොරතුරු පද්ධතියක් සැකසීම.





- වඩා නිර්මාණශීලි හා තාක්ෂණයෙන් පිරිපුන් තරුණ තරුණියන් සඳහා අවශ්‍ය වන යාවත්කාලීන තොරතුරු, තරුණ ප්‍රජාවට ලබා දීම සඳහා **ජාතික තරුණ තොරතුරු කේන්ද්‍රය නිර්මාණය කිරීම.**
  (I .Center)







- යෞවන සමාජ තුල කටයුතු කරන තරුණ තරුණියන්ගේ තොරතුරු ලබා ගැනීම සඳහා වූ තොරතුරු පද්ධතියක් ඇති කිරීම හා යාවත්කාලීන කිරීම.

4.13 විභාග හා ඇගයීම් අංශය.

ප්‍රධාන කාර්යභාරය



- දිවයින පුරා මධ්‍යස්ථාන 54 ක පාඨමාලා 64 ක් වෙනුවෙන් වර්ෂයකට දෙවරක් (මාස හයෙන් හයට) පූර්ණ කාලීන හා අර්ධ කලීන,NVQ හා NON NVQ සිසුන් 12,114 ක සංඛ්‍යාවක් සඳහා ප්‍රායෝගික හා ලිඛිත අවසන් පරීක්ෂණ විධිමත්ව හා ක්‍රමවත්ව ලෙස පවත්වන ලදි. මාර්ගස්ථ ක්‍රමය යටතේ විභාග පැවැත්වීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් 06ක් 250කගේ සහභාගීත්වයෙන් ක්‍රියාත්මක කෙරුණි.

- අවසන් පරීක්ෂණ නිම කළ පසු තෙමසක් ගත වීමට පෙර විභාග ප්‍රතිඵල මධ්‍යස්ථාන වෙත නිකුත් කරමින් සමත් වූ අභ්‍යාසලාභීන් සඳහා මධ්‍යස්ථාන මට්ටමින් NVQ හා Non NVQ සහතිකපත් ඉතා කඩිනමින් හා ක්‍රමවත්ව බෙදා දීම සිදු කෙරේ.

❖ ජාතික තරුණ සේවා සභාවේ පුහුණු මධ්‍යස්ථානයන්හි පවත්වනු ලබන නිපුණතා පාදක පාඨමාලා සඳහා ඇගයීම් පවත්වා ජාතික හා ජාත්‍යයන්තරව පිළිගනු ලබන ජාතික වෘත්තීය සුදුසුකම් සහිත NVQ සහතිකපත් නිකුත් කිරීම.

4.14 විශේෂ ව්‍යාපෘති අංශය

01. ජාතික තරුණ සේවා සභාවේ අවස්ථානුකූලව සංවිධානය කරන ලද ව්‍යාපෘති සැළසුම් කිරීම/ සංවිධානය කිරීම හා ක්‍රියාත්මක කිරීම මෙමගින් සිදු වේ. විශේෂයෙන්ම දේශපාලන තිරණ ගැනිම, ප්‍රතිපත්ති සැකසිම වැනි දෑ සඳහා තරුණ තරුණියන්ගේ ඉහළ සහභාගීත්වයක් ඇති කිරීම උදෙසා නවීන තාක්ෂණය උපයෝගී කරගෙන තරුණ පාර්ලිමේන්තුව සඳහා මන්ත්‍රී මණ්ඩලය තෝරා ගැනීමේ මැතිවරණය සිදු කරන ලදි. මාර්ගස්ථ ක්‍රමයට තරුණ තරුණියන් 141,820කගේ සහභාගීත්වයෙන් මැතිවරණය සිදු කරන ලදි. මේ සඳහා අමාත්‍ය මණ්ඩලය තෝරා ගැනීමට 71ක්ද සහභාගී වී ඇත.





තවද 05වන පාර්ලිමේන්තු සැසිවාරය පවත්වන අතර ඒ සඳහා වූ දැනුවත් කිරීමේ වැඩසටහන්ද පවත්වන ලදි. තරුණ තරුණියන් 1,226කගේ සහභාගීත්වයෙන් අවස්ථා 03කදී තරුණ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ ධාරිතා සංවර්ධන වැඩසටහන් පවත්වන ලදි. තරුණ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සහභාගීත්වයෙන් දිස්ත්‍රික් වල ආපදා කළමනාකරණය හා පෞරුෂ සංවර්ධන වැඩසටහන් 18ක් 1,124කගේ සහභාගීත්වයෙන් පවත්වන ලදි. මෙලෙස 2020 වර්ෂය තුළ තරුණ පාර්ලිමේන්තු මන්ත්‍රී 361 සඳහා විවිධ වැඩසටහන් සමාජ දුරස්ථභාවය තබා ගනිමින් ක්‍රියාත්මක කිරීමට හැකියාව ලැබුණි.



4.15 යෞවන නිළිණ අධිකාරිය.

එංගලන්තයේ එඩින්බරෝ ආදිපාද ජාත්‍යන්තර නිළිණ පදනම මඟින් ආරම්භ කරන ලද එඩින්බරෝ ආදිපාද ජාත්‍යන්තර නිළිණ වැඩසටහන 1980 වර්ෂයේ සිට ශ්‍රී ලංකාවේ වයස අවුරුදු 13-24 ත් අතර තරුණ කණ්ඩායම උදෙසා හඳුන්වා දී ක්‍රියාත්මක කිරීම යෞවන නිළිණ ප්‍රධාන අංශයේ ප්‍රමුඛ කාර්ය වේ.

ශිෂ්ට සමාජය රදාපවතින්නේ ඒ ඒ සාමාජිකයන්ගේ නිදහස, බුද්ධිය, වගකීම හා චර්යා හා ප්‍රමිතීන් මතය යන විශ්වාසය මත ජාතික යෞවන තිළිණ ප්‍රදාන වැඩසටහනේ දර්ශණය පදනම් වී ඇත

ඒ අනුව මෙම වවැඩසටහනට සම්බන්ධ වන වැඩෙන තරුණ ජනයාගේ රැකියා නියුක්තිය සඳහාත්, තම පෞරුෂ වර්ධනය කර ගැනීම සඳහාත් මෙන්ම පුද්ගලයා නොවැදගත් අංශුවක් ලෙස සැලකෙන වත්මන් සමාජ පසුබිමක, තරුණයාට හිමිකර ගැනීම සඳහා අත්‍යවශ්‍ය ක්‍රියාකාරකම් ඇතුළත් මෙම වැඩසටහන තරුණයාගේ අනාගතය යහපත් කිරීමට ඉමහත් පිටුවහලක් වනු ඇත.



අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමැතියෙන් විෂය සමගාමී වැඩසටහනක් ලෙස රජයේ පාසල් සිසුන් සඳහා හඳුන්වා දී ක්‍රියාත්මක කරන මෙම වැඩසටහන තුළින්, වැඩසටහනට සම්බන්ධ වී (ස්වෙච්ඡා සේවය, කුසලතා, ශාරීරික විනෝද ක්‍රියා හා ගවේෂණ) යන ක්‍රියාකාරකම් සම්පූර්ණ කිරීමෙන් පසුව එම ක්‍රියාකාරකම් ඇගයීමකට ලක්කර වාර්ෂිකව ලෝකඩ, රජත, ස්වර්ණ ලෙස ජාත්‍යන්තර තිළිණ හා සහතිකපත් ජාතික උත්සවයකදී ප්‍රදානය කරනු ලැබේ. 2020 වර්ෂයේ වැඩසටහන් 06ක් ක්‍රියාත්මක කර ඇති අතර ඒ සඳහා 272ක සහභාගීත්වයක් පවතී. මීට අමතරව පාසල් 11ක සිසුන් 88කගේ සහභාගීත්වයෙන් රුක් රෝපණ වැඩසටහනක් ක්‍රියාත්මක කර ඇත. තවද යෞවන තිළිණ ඒකක (පාසල්) 02ක ගවේශන වැඩසටහන් 02 තරුණ තරුණියන් 30කගේ සහභාගීත්වයෙන් පවත්වන ලදි.

4.16 තරුණ සමූපකාර හා ව්‍යාපාර සහ සංවර්ධන අංශය.

ලාංකික තරුණ ප්‍රජාවගේ ආර්ථික අස්ථාවරත්වය අවම කිරීමට මඟ පෙන්වමින් ව්‍යවසායක සංස්කෘතියක් රටතුළ ගොඩනැංවීමට පුරෝගාමීව කටයුතු කිරීම මෙහිදී ප්‍රධාන අරමුණ වේ.

උපරිම ඵලදායීතාවයකින් හා කාර්යක්ෂමතාවයකින් යුතුව දැනුම, ආකල්ප හා කුසලතා පරිපූර්ණ සේවක මණ්ඩලයකින් විවිධ උත්පාදන ව්‍යාපෘති ක්‍රියාත්මක කරමින් තරුණ ව්‍යවසායකයින්ට සේවා සැපයීම සඳහා තරුණ සමුපකාර ජාලය ගුණාත්මක, ප්‍රමාණාත්මක හා තිරසාර ලෙස සංවර්ධනය කිරීම මෙමඟින් සිදුවේ.

2020 වර්ෂයේ තරුණ ව්‍යවසායකත්ව කුසලතා වර්ධනය කිරීම උදෙසා වැඩමුළු 18ක් තරුණ තරුණියන් 600කගේ සහභාගීත්වයෙන් ක්‍රියාත්මක කරන ලදි.

5.පාලන අංශයේ ක්‍රියාකාරකම්

5.1ආයතනික කටයුතු.

1979 අංක 69 දරණ ජාතික තරුණ සේවා පනත යටතේ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම පිණිස අවශ්‍ය වන සේවක සංඛ්‍යාව බඳවා ගැනීම යටතේ ආයතන අංශයට පැවරී ඇති කාර්ය භාරය අනුව 2020 වර්ෂය තුළදී උසස්වීම් ලබාදී ඇත. එහෙත් ස්ථාන මාරුවීම්,විනයානුකූල නියෝග අනුව සේවයෙන් පහකිරීම්,ධුරය අතහැර යෑම්,වැටුප් හා වේතනයන්,සේවයෙන් විශ්‍රාම ගැන්වීම් හා සේවයෙන් ඉල්ලා අස්වීමද පුර්ණ වර්ෂවලදී කටයුතු කර ඇති ආකාරයෙන්ම සිදුවී ඇත. අනුමත සේවක සංඛ්‍යාව හා පුරප්පාඩු සේවක සංඛ්‍යාව පිළිබඳව විස්තර පහත දැක්වේ.

- **නව බඳවා ගැනීම් (කොන්ත්‍රාත්)**
  නව බඳවා ගැනීම් 3 ක් (ලේකම්- 01, සහකාර අධ්‍යක්ෂ - 01, අධ්‍යක්ෂ (කාර්මික හා වෘත්තීය පුහුණු - 01) සිදු කර ඇත.
- **විශ්‍රාම ගැන්වීම**
  නිළධාරින් 34 දෙනෙකු විශ්‍රාම ගන්වන ලදි.

- **සේවයෙන් ඉල්ලා අස්වීම**
  විවිධ හේතූන් මත 2020 වර්ෂයේදී නිළධාරින් 03ක් සභාවේ සේවයෙන් ඉල්ලා අස්වී ඇත.

- **සේවය අවසන් කිරීම**
  විවිධ හේතූන් මත නිළධාරීන් 25කගේ සේවය අවසන් කර ඇත.

2020 වර්ෂයේ දී සභාවේ එක් නිළධාරියකු මිය ගිය ගොස් ඇත.

5.2 ප්‍රසම්පාදන අංශය.

ප්‍රසම්පාදන අංශය ප්‍රධාන වශයෙන් කරනු ලබන්නේ ප්‍රධාන කාර්යාලය, පළාත් කාර්යාලය, දිස්ත්‍රික් කාර්යාල, පුහුණු මධ්‍යස්ථාන යන මේවායේ ඇති වන අවශ්‍යතා (සේවා හා භාණ්ඩ වශයෙන්) විධිමත් අනුමැතියක් සමඟ කරනු ලබන ඉල්ලීමෙන් පසු ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කරමින් එම කාර්යයන් ඉටු කිරීමයි.

2020 වර්ෂයේදී ජාතික තරුණ සේවා සභාවේ ප්‍රධාන කාර්යාලය මඟින්, අනෙකුත් කාර්යාල මඟින් හා පුහුණු මධ්‍යස්ථාන මඟින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් සඳහා භාණ්ඩ හා සේවා සපයමින් කටයුතු කර ඇත.

5.3 ප්‍රවාහන අංශය.

ජාතික තරුණ සේවා සභාවේ මූලික අරමුණු ඉටු කර ගැනීම සඳහා විවිධ අංශ වලින් ක්‍රියාක්මක කරනු ලබන වැඩසටහන් වලදී ප්‍රධානතම සහය සේවාවක් වශයෙන් කාර්යක්ෂම ප්‍රවාහන සේවයක් ලබා දෙමින් වැඩසටහන් සාර්ථක කර ගැනීමට කටයුතු කරයි.

- ප්‍රධාන කාර්යාල සංචිත, පළාත් කාර්යාල, දිස්ත්‍රික් කාර්යාල, පුහුණු මධ්‍යස්ථාන , ගොවිපල සඳහා අනුයුක්ත කර ඇති වාහන සේවා කිරීම හා අලුත්වැඩියා කිරීම.
- රිය අනතුරු සම්බන්ධයෙන් පරීක්ෂණ කටයුතු කිරීම.
- රියදුරු පාලනය, ධාවන සටහන් ගෙන්වා ගැනීම, පරීක්ෂා කිරීම, දෝෂ සහගත තත්වයන් සම්බන්ධයෙන් කරුණු විමසීම, ධාවන සටහන් රජයේ විගණන අංශයට යොමු කිරීම.
- වාහන සඳහා වාර්ෂික දුම් පරීක්ෂණ වාර්තා , ආදායම් බලපත්‍ර , රක්ෂණ සහතික ලබා ගැනීම.
- වැඩසටහන් සඳහා ගමනාගමන මණ්ඩලයෙන් බස් රථ ලබා ගැනීම සම්බන්ධීකරණය කිරීම.

5.4 අභ්‍යන්තර විගණක අංශය.

ජාතික තරුණ සේවා සභාවට අදාළව විගණකාධිපති විසින් අනුමත කර ඇති විගණන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා සභාපතිතුමාගේ උපදෙස් මත කෙරෙන විමර්ෂන හා වෙනත් විශේෂ රාජකාරී ඉටුකිරීම මෙම අංශයේ ප්‍රධාන කාර්යභාරය වේ.

5.5 ලේකම් අංශය.

ලේකම් අංශය මගින් ජාතික තරුණ සේවා සභාවේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සංවිධානය කිරීම, පවත්වාගෙන යාම, එහිදී ගන්නා ලබන තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා අදාල අංශ සහ අධ්‍යක්ෂවරුන්, නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් වෙත බෙදාදීම සිදු කරනු ලබයි. ඊට අමතරව ජාතික තරුණ සේවා සභාවේ වෙනත් වැඩ සටහන් වලට අදාලව අවස්ථානුකූලව පවරනු ලබන රාජකාරී කටයුතු ද ඉටු කරනු ලැබේ.

5.6 නීති විමර්ෂණ ක්‍රියාකාරකම්.

ජාතික තරුණ සේවා සභාව විසින් පවරා ඇති නඩු සම්බන්ධව හා මෙම සභාවට එරෙහිව පවරා ඇති නඩු පිළිබඳව මෙම සභාව වෙනුවෙන් හා/හෝ සභාපති අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට පෙනී සිටීම හා කරුණු ඉදිරිපත් කිරීම ද , අවශ්‍යතාවය අනුව නීතිපති දෙපාර්තමේන්තුව සම්බන්ධීකරණය කිරීම ආදි කටයුතු නීති විමර්ශන අංශය මගින් සිදුකෙරේ.

5.7 ඉදිකිරීම් ක්‍රියාකාරකම්.

ඉදිකිරීම් / නඩත්තු අංශය මඟින්, දිවයින පුරා පවතින සියළුම පළාත් කාර්යාල , දිස්ත්‍රික් කාර්යාල හා තරුණ මධ්‍යස්ථාන වල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම හා වෘත්තීය පුහුණුවට අදාළ ගොඩනැගිලි ඉදිකිරීම් හා නවීකරණය කරන අතර තරුණ මධ්‍යස්ථාන දෛනික නඩත්තු කටයුතු සහ මධ්‍යස්ථාන නවීකරණය හා අළුත්වැඩියා කටයුතු ඉටුකරනු ලබයි.

ඒ අනුව 2020 වර්ෂයේ ව්‍යාපෘති 10ක් සම්පූර්ණයෙන් අවසන් කර අදාළ මධ්‍යස්ථානයට භාර දී ඇති අතර, අනෙකුත් ව්‍යාපෘති 2021 වර්ෂයේ අවසන් වීමට නියමිතය.

අනු අංකය	ව්‍යාපෘතිය	භෞතික ප්‍රගතිය %
01	හලාවත පුහුණු මධ්‍යස්ථානය ප්‍රතිසංස්කරණය කිරීම අවසන් අදියර	65%
02	බෙල්වුඩ් පුහුණු මධ්‍යස්ථානය නවීකරණය - අදියර 1	40%
03	බෙල්වුඩ් පුහුණු මධ්‍යස්ථානය නවීකරණය - අදියර 11	20%
04	සපුගස්කන්ද පුහුණු මධ්‍යස්ථානය නවීකරණය - අදියර 1	වැඩ අවසන් කර ඇත
05	පොල්ගොල්ල පුහුණු මධ්‍යස්ථානය ඉදිකිරීම	40%
06	අකුරැස්ස පුහුණු මධ්‍යස්ථානය ඉදිකිරීම	වැඩ අවසන් කර ඇත
07	මහරගම තරුණ මධ්‍යස්ථානය ගබඩාව හා රියදුරු නේවාසිකාගාරය ඉදිකිරීම.	95%
08	අනුරාධපුර යොවුන් නිකේතනය කාය වර්ධන මධ්‍යස්ථානය ඉදිකිරීම	වැඩ අවසන් කර ඇත
09	මහරගම තරුණ මධ්‍යස්ථානය පිහිනුම් තටාකය ඉදිකිරීම	වැඩ අවසන් කර ඇත
10	මාතර දිස්ත්‍රික් කාර්යාලය නවීකරණය	වැඩ අවසන් කර ඇත
11	මහරගම තරුණ මධ්‍යස්ථානය වහලය නවීකරණය - අදියර 11	වැඩ අවසන් කර ඇත
12	බටංගල පුහුණු මධ්‍යස්ථාය නවීකරණය (2 අදියර)	වැඩ අවසන් කර ඇත
13	නුවරඑළිය සංචාරක බංගලාව ඉදිකිරීම	45%
14	සපුගස්කන්ද පුහුණු මධ්‍යස්ථානය නවීකරණය අදියර 11	වැඩ අවසන් කර ඇත
15	පානදුර පුහුණු මධ්‍යස්ථානයේ wash room	වැඩ අවසන් කර ඇත
16	බටංගල පුහුණු මධ්‍යස්ථාය නවීකරණය (1 අදියර)	වැඩ අවසන් කර ඇත

6. ස්වේච්ඡා වැඩසටහන්.

ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස වල සේවය කරන තරුණ සේවා නිලධාරීන් යෞවන සමාජ හා තරුණ පාර්ලිමේන්තුව නියෝජනය කරනු ලබන තරුණ තරුණියන් සමග ප්‍රාදේශීයව හා කාලීන අවශ්‍යතාවයන් අනුව ස්වේච්ඡාවෙන් හෝ ස්වේච්ඡාවෙන් සොයා ගත් ප්‍රතිපාදන මගින් විවිධ වැඩසටහන් සංවිධානය කරන ලදී. විවිධ ක්ෂේත්‍රයන් ආශ්‍රිතව වැඩසටහන් ක්‍රියාත්මක කර ඇති අතර, මෙම වැඩසටහන් තුළින් යෞවන සමාජවල සාමාජික සාමාජිකාවන් තුළ පමණක් නොව ප්‍රදේශවාසීන් හා යෞවන යෞවනියන් අතර අන්තර් සහජීවනය සමගිය ඇති වේ .රටේ යම් හෝ

සංවර්ධන කාර්යය සඳහා ස්වේච්ඡාවෙන් තරුණ පිරිස් යොදා ගැනීම මෙම ස්වේච්ඡා වැඩසටහන් තුළින් සිදුකෙරේ.

2020 වසරේ වාර්තා වූ ස්වේච්ඡා වැඩසටහන් 1148 ක් වූ අතර, 72 307 ක තරුණ පිරිසක් සහභාගිව ඇත. ඔවුන්ගේ ස්වේච්ඡා සේවය සඳහා ලබා දුන් මුල්‍යමය වටිනාකම රුපියල් 31 292 567.00 ක් ලෙස සඳහන් කළ හැක.

ස්වෙච්ඡා වැඩසටහන් - 2020			
දිස්ත්‍රික්කය	**මුළු වැඩසටහන් සංඛ්‍යාව**	**මුළු සහභාගිත්වය**	**අපේක්ෂා කරන ලද මුළු වටිනාකම**
කොළඹ	**16**	**1100**	**36,000.00**
ගම්පහ	**88**	**1877**	**861,000.00**
ගාල්ල	**101**	**5681**	**488,300.00**
මාතර	**61**	**2135**	**670,000.00**
හම්බන්තොට	**27**	**754**	**64,900.00**
මහනුවර	**05**	**367**	**283,000.00**
මාතලේ	**27**	**1427**	**324,500.00**
නුවරඑළිය	**40**	**1200**	**720,000.00**
රත්නපුරය	**72**	**810**	**760,750.00**
බදුල්ල	**34**	**3617**	**1,777,000.00**
මොණරාගල	**56**	**2254**	**2,737,653.00**
පොළොන්නරුව	**15**	**4488**	**385,700.00**
අනුරාධපුර	**28**	**470**	**110,000.00**
ත්‍රිකුණාමලය	**05**	**1248**	**942,000.00**
අම්පාර	**75**	**1389**	**1,578,234.00**
මඩකලපුව	**27**	**734**	**64,900.00**
කුරුණෑගල	**97**	**7051**	**537,440.00**
පුත්තලම	**119**	**3300**	**363,050.00**
යාපනය	**119**	**29495**	**16,804,400.00**
වව්නියාව	**53**	**1559**	**101,540.00**
මන්නාරම	**15**	**318**	**22,550.00**
මුලතිව්	**39**	**558**	**116,250.00**
කිලිනොච්චි	**29**	**475**	**1,543,400.00**
	1148	72307	31,292,567.00

***පාරිසරික/ සෞඛ්‍ය හා සනිපාරක්ෂක සේවා/ ක්‍රීඩා සංවර්ධන/ අධ්‍යාපනික/නායකත්ව කුසලතා / වෘත්තිය මාර්ගෝපදේශණ යනාදි ස්වෙච්ඡා වැඩසටහන්

7. කාර්යසාධන වාර්තාව - 2020

අ.ආයතනයේ කාර්ය සාධනය

1. ප්‍රතිපාදන සැලසීම

2020 වර්ෂය තුළ ජාතික තරුණ සේවා සභාවේ සමස්ත ලැබීම් වලින් රු. මි. 1,740.361 ක් මහා භාණ්ඩාගාරයෙන් ද අමාත්‍යාංශය හා රාජ්‍ය ආයතන හරහා රු. මි. 163.927 ක් ද ලැබී ඇත. එයින් රු. මි. 1,302.975 ක් පුනරාවර්ථන වියදම් වශයෙන් හා රු. මි. 552.425 ක් ප්‍රාග්ධන වියදම් වශයෙන් වැයකර ඇත. එම වසරේ ජාතික තරුණ සේවා සභාව සිය අභ්‍යන්තර ආදායම් මාර්ගවලින් රු. මි. 151.170 ක් උපයාගෙන තිබේ.

2. සංවර්ධන වැඩසටහන්

ජාතික තරුණ සේවා සභාව වර්ෂය තුළ ක්‍රියාත්මක කළ සංවර්ධන වැඩසටහන් යටතේ තරුණ කුසලතා සංවර්ධනය සඳහා වූ දේශීය වැඩසටහන් 463 ක් 158,800 ක තරුණ පිරිසකගේ සහභාගීත්වයෙන් පවත්වා ඇත. ඒ සඳහා වැයකර ඇති මුදල රු. මි. 117.122 කි. 2020 දී පැවැත්වූ තරුණ ක්‍රීඩා සංවර්ධන ක්‍රියාකාරකම් අතර 32 වැනි ජාතික යෞවන ක්‍රීඩා උළෙලට සමගාමීව ප්‍රාදේශිය මට්ටමේ තරඟ, තරුණ සේවා විශේෂ ක්‍රීඩා සංචිතය මෙන්ම සෞන්දර්ය කුසලතා සංවර්ධන ක්‍රියාකාරකම් යටතේ ජාතික යෞවන සම්මාන තරඟාවලියේ දිස්ත්‍රික් හා පළාත් තරඟ, නාට්‍ය සංචිතය පවත්වන ලදි. ඊට අමතරව ජාතික සංස්කෘතික වැඩසටහන් හා අමාවක පහන් වැස්ස වැඩසටහන පැවැත්වීමට ද ජාතික තරුණ සේවා සභාව කටයුතු කර ඇත. ශ්‍රී ලංකාවේ ප්‍රථම වතාවට තරුණ පාර්ලිමේන්තු ඡන්දය Online ක්‍රමයට පැවැත්වීම සිදු කරන ලදි.

3. කාර්මික හා වෘත්තීය පුහුණු ක්‍රියාකාරකම්

කාර්මික හා වෘත්තීය පුහුණු ක්‍රියාකාරකම් යටතේ ජාතික තරුණ සේවා සභාව පුහුණු මධ්‍යස්ථාන 54කදී පැවැත්වූ පූර්ණකාලීන හා අර්ධකාලීන පුහුණු පාඨමාලා 661 ක් සඳහා බඳවාගත් සිසුන් සංඛ්‍යාව 16,569 ක් වේ. එයින් සිසුන් 4,399 ක් NVQ මට්ටමේ පාඨමාලා අවසන් කර ඇත.

4. ව්‍යවසායකත්ව හැකියා සංවර්ධනය

ජාතික ව්‍යවසායකත්ව හැකියාවන් වර්ධනය කිරීම අරමුණු කරගෙන ජාතික තරුණ සේවා සභාව විසින් පැවැත් වූ වැඩසටහන් සඳහා 2020 දී රු. මි. 0.999 ක් වැය කර ඇති අතර ඒ යටතේ පැවැත්වූ පුහුණු වැඩසටහන් 19 ක් සඳහා 678 ක් සහභාගීවී ඇත. තවද, නව නිෂ්පාදන ක්ෂේත්‍ර 09ක් (කෘෂි තාක්ෂණික උපකරණ, කෘෂිකර්මාන්තය මුල් කරගත් අගය එකතු කළ නිෂ්පාදන, සීසුයෙන් අලෙවි

වන පාරිභෝගික භාණ්ඩ, විද්‍යුත් උපකරණ, රොබෝ තාක්ෂණය හා කෘතිම බුද්ධිය, අන්තර්ජාලික කරුණු, ජනතා කේන්ද්‍රීය තොරතුරු තාක්ෂණ සේවා, ඇඟලුම් ක්ෂේත්‍ර) ඔස්සේ තරුණ තරුණියන් 1,112ක ප්‍රමාණයක් නව නිෂ්පාදන සිදු කිරීමට පොළොඹ වන ලදි. කෘෂි ආර්ථිකයන්ගෙන් ඉවතට යන තරුණ තරුණියන්ගේ ආකල්ප වෙනස් කරමින් ඔවුන් දේශීය ආර්ථිකය වෙත මැදිහත් කරවීම මෙන්ම කොවිඩ් - 19 වසංගත තත්වය හේතුවෙන් යම්තාක් දුරකට හෝ පසුබෑමකට ලක් වූ නව නිර්මාණකරුවන් නැවත දිරිගන්වමින් නව තරුණ ව්‍යවසායකත්වය සඳහා උපරිම අවස්ථාවන් ලබා දීම සුවිශේෂ අවස්ථාවකි

5. ගොවිපල සංවර්ධනය

ජාතික තරුණ සේවා සභාව 2020 වර්ෂය තුළ ගොවිපල මධ්‍යස්ථාන 19 කදී කෘෂි පාඨමාලා 10ක් පවත්වා ඇති අතර මෙම ව්‍යාපෘතිය යටතේම “අපේ ගෙවත්ත” වැඩසටහනද දිවයින පුරා ක්‍රියාත්මක කරන ලදි. මෙහි දී තරුණයන් 34,524 ගෙවතු වගාව සඳහා යොමු වන ලදි. සතුන්ගේ ආහාර සඳහා යොදාගන්නා “චෝගම්” ඩ්‍රෝන් තාක්ෂණය ඔස්සේ ප්‍රථම වතාවට වගා කිරීම, හතු වගාවේ මාධ්‍ය බදුන් නිපදවීම සඳහා යොදාගන්නා වෙලදපලේ රු 300,000.00 ක් වටිනා යන්ත්‍රය රු 150,000.00 වැනි මුදලකට තරුණ සේවා සභාව විසින්ම නිපදවීම විශේෂ ජයග්‍රහනයක් වේ .

6. ජාත්‍යන්තර තරුණ සබඳතා

ජාත්‍යන්තර තරුණ සබඳතා විෂයයට අදාළව 2020 දී පැවැත්වූ තරුණ හුවමාරු වැඩසටහන් සඳහා 30 ක්, ජගත් තරුණ නෞකා වැඩසටහන සඳහා 08 ක් හා කලාපීය තරුණ සමුළු හා වැඩමුළු සඳහා තරුණ නියෝජිතයින් 01ක් සහභාගීවී ඇත. එඩින්බරෝ ආදිපාද ජාත්‍යන්තර තිළිණ වැඩසටහන ජාතික තරුණ සේවා සභාව විසින් 2020 වර්ෂයේද වැඩසටහන් 06ක් යටතේ 272ක සහභාගීත්වයකින් ක්‍රියාත්මක කරන ලදි. පොදු රාජ්‍ය මණ්ඩලිය යොවුන් පාර්ලිමේන්තු සංසදය සඳහා ශ්‍රී ලංකා යොවුන් පාර්ලිමේන්තු මන්ත්‍රී තේරී පත්වීමද විශේෂ ජයග්‍රහනයකි.

7. කාර්ය මණ්ඩල කටයුතු හා සංවර්ධනය

වර්ෂය තුළ ජාතික තරුණ සේවා සභාවේ කාර්ය මණ්ඩලයට නිලධාරීන් 03 ක් කොන්ත්‍රාත් පදනමින් බඳවාගෙන ඇත. වර්ෂය තුළ රු. මි. 1.344 ක් වැය කරමින් නිලධාරීන් 450 ක් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් 23 ක් පැවැත්වීමට කටයුතු කර ඇත.

8. ඉදිකිරීම් කටයුතු

2020 වර්ෂයේදී භාණ්ඩාගාර ප්‍රතිපාදන රු. මි. 171.597 යොදවා ඉදිකිරීම් හා නවීකරණ ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදි. මෙයින් ව්‍යාපෘති 10ක වැඩ අවසන් කර භාරදීම මෙම වසර තුළ සිදු විය.

ආ. කෙටිකාලීන හා මධ්‍යකාලීන ක්‍රියාමාර්ග

ආයතනයේ කාර්යසාධනය වර්ධනය කර ගැනීම සඳහා ඉදිරියේදී අනුගමනය කිරීමට අපේක්ෂිත කෙටිකාලීන හා මධ්‍යකාලීන ක්‍රියාමාර්ග පහත පරිදි වේ.

කෙටි කාලීන ක්‍රියාමාර්ග

1. සෞභාග්‍යයේ දැක්ම ජාතික ප්‍රතිපත්තිය ප්‍රකාරව තරුණ අවශ්‍යතාවයට ගැලපෙන පරිදි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
2. තාරුණ්‍යයේ නව කුසලතා සංවර්ධනය (Talent Development) සඳහා වැඩි අවධානයක් යොමු කර වැඩසටහන් නිර්මාණය කිරීම.
3. පුහුණු මධ්‍යස්ථාන නවීකරණය කර දේශීය හා විදේශීය රැකියා වෙළෙඳපොළට අවශ්‍ය නව පාඨමාලා මඟින් තරුණයන් සන්නද්ධ කර විදෙස් රැකියා අවස්ථා පදනම් කරගෙන ජාත්‍යන්තර භාෂා පාඨමාලා ආරම්භ කිරීම.
4. උසස් තත්වයේ නව තාක්ෂණික උපකරණ භාවිතා කරමින් තරුණ ගොවිපල සංවර්ධනය හා තරුණයන්ගේ ආකල්ප සංවර්ධනය තුළින් ඔවුන් කෘෂිකර්මාන්තය කෙරෙහි නැඹුරු කිරීම.
5. පෞද්ගලික, රාජ්‍ය හා රාජ්‍ය නොවන, දේශීය හා විදේශීය ආයතන සමඟ ඒකාබද්ධ වී කටයුතු කිරීම.
6. තාරුණ්‍යය තුළ ස්වේච්ඡා සේවය පිළිබඳ යහපත් හැඟීම වර්ධනය කිරීම.
7. ආර්ථිකමය වශයෙන් තරුණයා සවිබල ගැන්වීම හා තරුණ ව්‍යවසායකයන් නිර්මාණ කිරීමට අවශ්‍ය පුහුණුව, තාක්ෂණික දැනුම ලබා දීම.
8. නිළධාරීන්ගේ දක්ෂතා හඳුනා ගනිමින් ඔවුන් නියමිත ස්ථාන වල ස්ථානගත කිරීම හා ඔවුන්ගේ දැනුම යාවත්කාලීන කිරීම සඳහා විවිධ ප්‍රයත්නයන් ගැනීම.

මධ්‍යකාලීන ක්‍රියාමාර්ග

1. තරුණ කටයුතු සිදුකරන මූලස්ථානයක් බවට ජාතික තරුණ සේවා සභාව පත් කිරීම.
2. පවුල, ආයතනය, සමාජය තුළ ඵලදායී තරුණයෙකු බිහිකිරීම සඳහා තරුණයා මෙහෙයවීම හා සතුටින් ජීවත් විය හැකි පවුලක් නිර්මාණය කිරීම.
3. සංවිධාන ධූරාවලිය නවීකරණය කිරීම.
4. කාලීන අවශ්‍යතා අනුව ඉගෙනුම් හා පුහුණු අවශ්‍යතා තරුණයන් හට ලබා දීම.
5. ඵලදායී සේවයක් ආයතනය තුළ පවත්වා ගැනීම සඳහා පද්ධති (System) වර්ධනය කිරීම.
6. කාර්ය මණ්ඩලය අභිප්‍රේරණය කිරීම සඳහා විවිධ අවශ්‍යතා අනුව ඇගයීම් හා පුහුණු ලබා දීම.
7. ආයතනික දැක්ම අනුව උපායමාර්ග සැලසුම් කිරීම.
8. තරුණ තරුණියන් නව ව්‍යාපාරික අවස්ථාවන් සඳහා යොමු කිරීමට ක්‍රියාමාර්ග ගැනීම.
9. තරුණ තරුණියන් ජාතිකමය වශයෙන් තීරණ ගැනීමේ ක්‍රියාවලියට දායක කර ගැනීම තුල ඔවුන්ට ශ්‍රී ලාංකේය අභිමානය ඇති කිරීම.

8. 2020 වර්ෂයට අදාළ විගණන විමසුම් මඟින් දක්වා ඇති කරුණු නිවැරදි කිරීමට ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව.

විගණන විමසුම් අංකය	විගණන විමසුම හා එමගින් පෙන්වා දී ඇති කරුණු	නිවැරදි කිරීමට ගනු ලැබූ හා ඉදිරියේදී ගැනීමට අපේක්ෂිත ක්‍රියාමාර්ග
VTY/A/NYSC/2019/AQ/11	වේලා සටහන් යන්ත්‍ර භාවිතය පිළිබඳ පරීක්ෂාව.	සවි කරන ලද වේලා සටහන් යන්ත්‍ර වලට අදාලව ඒවායේ ක්‍රියාකාරිත්වයන් පිළිබඳව දෝෂ වාර්තා වීම හේතුවෙන් මේ පිළිබඳව සොයා බැලීම සඳහා කමිටුවක් පත් කරන ලද අතර නියමු වැඩසටහනක් ලෙස බස්නාහිර පළාත තුල ස්ථාපිත කර ඇති ඇඟිලි සලකුණු යන්ත්‍රයන්හි ක්‍රියාකාරිත්වය පරීක්ෂා කරන ලදී. ඒ අනුව මූලිකව බස්නාහිර පළාතේ වේලා සටහන් යන්ත්‍රයන්හි අඩුපාඩු සකස් කිරීම සඳහාත් ඉන්පසු ඉතිරි පළාත් ද ආවරණය වන පරිදි කටයුතු කිරීම සඳහා අදාල සැපයුම්කරු සමඟ අවබෝධතා ගිවිසුමකට එළඹීම සඳහා කටයුතු කර ඇත.
VTY/A/NYSC/2020/AQ/12	ආංශික නිපුනතා සංවර්ධන වැඩසටහනට අදාල ප්‍රගතිය පරීක්ෂාව.	යෝජිත පුහුණු මධ්‍යස්ථාන හැර වෙනත් පුහුණු මධ්‍යස්ථානයන්හිද ගොඩනැගිලි නවීකරණය කිරීම හා පාඨමාලා සංවර්ධනය කිරීම තුලින් NVQ ප්‍රතිතනය ලත් පාඨමාලා ගණන වැඩිකිරීමට කටයුතු කර ඇත. 2015 වර්ෂය වන විට ප්‍රතිතනය ලත් පාඨමාලා ගණන 86 වූ අතර, 2019 දෙසැම්බර් වන විට ප්‍රතිතනය ලබා ඇති පාඨමාලා ගණන 220 දක්වා වැඩිකර ඇත. 2015 වර්ෂයෙන් පසු නව අභ්‍යාසලාභීන් 3000කට අධික පිරිසකට NVQ පාඨමාලා හැදෑරීමට පරිසරය නිර්මාණය කර ඇත.
VTY/A/NYSC/2019/AQ/13	යොවුන්පුරය - 2019 වැඩසටහන සඳහා කුලී පදනම මත ඩෝම්ස් ප්‍රසම්පාදනය පරීක්ෂා කිරීම.	යොවුන්පුර වැඩසටහන සඳහා කුලී පදනම මත ඩෝම්ස් ලබා ගැනීමට අදාලව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1.ප්‍රකාරව ලංසු කැඳවීම් සිදු කලද ලංසු පත්‍රිකා වල සඳහන් ආකාරයට කොන්ත්‍රාත් ප්‍රධානයෙන් දින 14 ක් ඇතුළත කොන්ත්‍රාත් ගිවිසුම් අත්සන් කල යුතු වුවත් එසේම නොකිරීම සම්බන්ධව අදාල අංශය වෙත ඉදිරියේදී මෙවැනි අතපසුවීම් සිදු නොවුන සේ කටයුතු කරන ලෙස දැනුවත් කර ඇති අතර මෙවැනි තත්ත්වයන් වලක්වා ගැනීම සඳහා පියවර ගැනීමට සටහන් කර ඇත.
VTY/A/NYSC/2019/AQ/14	2019 - යොවුන්පුර වියඳම් පිළිබඳ පරීක්ෂාව.	දින 05 ක කාලයක් පුරා තෝරාගත් ස්ථානයක් තරුණ තරුණියන් 8300 ක් ඉලක්ක

		කරගනිමින් පවත්වන ලද මෙම වැඩසටහන වඩාත් ආකර්ෂණීය හා නූතන තාක්ෂණය භාවිතයට ගනිමින් තාරුණ්‍යයේ කාලීන අවශ්‍යතා , කණ්ඩායම් කුසලතා, ජාතීන් අතර අන්‍යෝන්‍ය සම්බන්ධතා ගොඩනැංවීම හා ඔවුන්ගේ නිර්මණාත්මක කුසලතා වැඩි දියුණු කිරීමේ අරමුණු ඇතිව ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව විමසුමේ සඳහන් විඩියෝ වෝල්, විදුලි සැරසිලි, කොරණ ඉදිකිරීම්, කැප් සහ මග් ලබා දීම , මල්වෙඩි සංදර්ශන. විවෘත වේදිකා සකස් කිරීම, තාවකාලික 3D තාක්ෂණය සහිත සිනමා ශාලා ඉදිකිරීම වැනි කාර්යයන් ඉටු කිරීම වෙනුවෙන් වැය දැරීම් සිදු කර ඇත. ඉදිරියේදී මෙවැනි වැඩසටහන් සැලසුම් කිරීමේදී ඒ සඳහා වන වැයදැරීම් අපේක්ෂිත ප්‍රතිපාදන සීමා ඉක්ම නොයවා කටයුතු කිරීමටත්, ඵලදායී ලෙස තරුණ සංවර්ධනය සඳහා ඉවහල් වන ආකාරයට පැවැත්වීම සඳහාත් පියවර ගැනීමට අපේක්ෂා කෙරේ.
VTY/A/NYSC/2019/AQ/15	2019යොවුන්පුරය- වීරවිල වැඩසටහන ට අදාලව දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු, තාක්ෂණික ඇගයීම් කමිටු පත්කිරීම හා රැස්වීම් වලට සහභාගි වූ සාමාජිකයින්ට ගෙවීම් පරීක්ෂා කිරීම.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.1. අ. ප්‍රකාරව තාක්ෂණික ඇගයීම් කමිටු පත් කරන ලද අතර ප්‍රසම්පාදන කමිටු සාමාජිකයෙකු තාක්ෂණික ඇගයීම් කමිටුවේත් සාමාජිකයෙකු නොවිය යුතු බවට දක්වා ඇති අතර ඊට අනුකූල නොවී එකම සාමාජිකයෙකු මෙම කමිටු දෙකෙහිම නියෝජනයක් සිදු කිරීම හේතුවෙන් වැඩිපුර ගෙවීම් කර තිබූ රු.3000 ක මුදල නැවත එය කර ගැනීමට කටයුතු කරන ලදී. ඉදිරියේදී මෙවැනි නියෝජනයන් සිදු නොවන ආකාරයට කටයුතු කරන ලෙසට ප්‍රසම්පාදන අංශය වෙත උපදෙස් ලබා දෙන ලදී.
VTY/A/NYSC/2019/AQ/16	ජාතික තරුණ මධ්‍යස්ථාන ක්‍රීඩා සමාජය සම්බන්ධ විගණන පරීක්ෂාව.	ක්‍රීඩා සමාජයේ කටයුතු ප්‍රතිසංවිධානය කිරීමට පියවරගෙන ඇත. විමසුමෙන් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කර ඇත.
VTY/A/NYSC/2019/AQ/17	මූල්‍ය ප්‍රකාශන විගණනය - 2019.	මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ ප්‍රමාදය සම්බන්ධයෙන් සලකා බලන විට 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයන්හි අන්තර්ගතයන් පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට ප්‍රමාද වීම හේතුවූ අතර ඉදිරියේදී මෙවැනි තත්ත්ව ඇති නොවීමට සැලකිලි වී ඇති අතර 2020 වර්ෂයට

		අදාල මූල්‍ය ප්‍රකාශන නියමිත දිනයට ලබා දීම සිදු කර ඇත. ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සි/ස තරුණ සේවා පුද්ගලික සමාගමේ විගණිත ගිණුම් නියමිත පරිදි අදාල කාලපරිච්ඡේදයන් තුලදීම සකස් කර ඉදිරිපත් නොකිරීම හේතුවෙන් මෙම තත්ත්වය ඇති වී ඇති අතර මේ සම්බන්ධව සභා අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කිරීමට ද පියවර ගෙන ඇත. ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 2020 වර්ෂයේ සිට ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 1 හි 99 ඡේදයට අනුව උපචිත වියදම් සමාලෝචිත වර්ෂයේදීම හඳුනාගැනීමෙන් අනතුරුව ගිණුම්ගත කිරීම සඳහා කටයුතු කර ඇත. ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 7ට අනුව වත්කම් ප්‍රත්‍යාගණනය කිරීම සඳහා ඉදිරියේදී කටයුතු කර දළ දාරණ අගය හෙලිදරව් කිරීමට කටයුතු කරනු ලැබේ. ගිණුම්කරණ අඩුපාඩු 1. ජංගම වත්කම් ලෙස පෙන්වා ඇති කෙරීගෙන යන වැඩ ගිණුමේ ශේෂය 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළින් නිවැරදි කර ඇත. 2. විමසුමේ සඳහන් සභාවට නීත්‍යානුකූලව අයිතිය තිබූ ඉඩම් 05 හි ඇතුලත් උඟව පළාත් කාර්යාලය හා බදුල්ල දිස්ත්‍රික් කාර්යාලය පිහිටි ඉඩමට අදාල තක්සේරු වටිනාකම් මේ වන විට ගිණුම්ගත කර ඇත. ඉතිරි ඉඩම් සම්බන්ධව ඉදිරියේදී තක්සේරු වාර්තා ලබා ගැනීම සඳහා පියවර ගෙන ඇති අතර ඒ අනුව තක්සේරු වාර්තා ලැබුණු පසු වටිනාකම් ගිණුම්ගත කිරීම සඳහා පිවයර ගැනීමට කටයුතු කෙරේ.
VTY/A/NYSC/2020/AQ/01	වාහන පරිහරණය පිළිබඳ පරීක්ෂාව	රේඛීය අමාත්‍යාංශය සතු වාහන 03 ක් ජාතික තරුණ සේවා සභාව විසින් පවරා ගැනීමෙන් තොරව පරිහරණය කිරීම් සම්බන්ධව මේ වන විට එම වාහන පවරා ගැනීම සඳහා අවස්ථා කීපයකදී අදාල අමාත්‍යාංශයන් වෙත ලිපි යොමු කර තිබුණද මේ වන තෙක් පවරා දීම් කටයුතු සිදු කර නැත.

		දෛනිකව ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ වාහන 40 ක් පමණ නවතා තබන අතර ඉතිරි වාහන නවතා තැබීම සඳහා වාහන රථගාලක් ඉදිකිරීම සඳහා කටයුතු කරන බව. සී/ස තරුණ සේවා සභාව විසින් සී/ස තරුණ සේවා සමාගමේ පරිහරණය සඳහා ලබා දී ඇති වාහනය වෙනුවෙන් වාරික වශයෙන් මුදල් අය කර ගැනීමට කටයුතු කර ඇති අතර ඒ අනුව 2020.08.31 දින වන විට රු.11,92400 ක මුදලක් අය කර ගෙන ඇත. 506575, 567972, 567967, යන වාහන වෙන්දේසි කිරීම සඳහා කටයුතු කර ඇති අතර 517262, 520274, 535863, 535859, 567964,567670, යන වාහන සම්බන්ධව වෙන්දේසි කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීම සඳහා අමාත්‍යාංශයට යොමු කර ඇත. ධාවන සටහන් විධිමත්ව සකස් කර මාසිකව රජයේ විගණක අංශය වෙත ලබා දීම සඳහා කටයුතු කරමින් පවතී. වාහන වල මුළු ඉන්ධන ධාරිතාවය වාහන වලට යොදා ඉන්ධන පරිභෝජනය පරීක්ෂා කිරීම සඳහා පවතින ප්‍රතිපාදන සීමාවන් තුල කටයුතු කිරීම සඳහා පියවර ගෙන ඇත.
VTY/A/NYSC/2020/AQ/02	ක්‍රීඩා සමාජයේ ගෙවීම් වවුචර් පිළිබඳ පරීක්ෂාව.	ක්‍රීඩා සමාජයේ ආදායමින් ක්‍රීඩා සමාජයේ අරමුණු ඉටුකර ගැනීම සඳහා සෘජු සම්බන්ධතාවයක් නොමැති වැයදැරීම් සිදු නෙකරන ලෙස අදාල නිලධාරින්ට උපදෙස් ලබා දී ඇති අතර මේ වන විට මෙවැනි ගෙවීම් සිදු නොකරයි. ක්‍රීඩා සමාජයේ කටයුතු විධිමත් කිරීම හා ප්‍රතිසංවිධානය කිරීමේ අරමුණු ඇතිව ඒ සඳහා වන යෝජනා ඇතුළත් සභා සංදේශයක් සභා අධ්‍යක්ෂ මණ්ඩලයට යොමු කර ඇත.
VTY/A/NYSC/2020/AQ/03	මැතිවරණ කටයුතු සඳහා රජයේ වාහන යොදා ගැනීම	2020.12.24 දින පැවති 85 වන විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදී මෙම විමසුමෙන් පෙන්වා දී ඇති කරුණු සම්බන්ධව අමාත්‍යාංශය මට්ටමින් පරීක්ෂණයක් පවත්වන ලෙස ලබාදුන් උපදෙස් අනුව අංක– NYSC/DA/OFFICE/E1/2020 හා 2020.12.15 දිනැති ලිපියෙන් අමාත්‍යාංශ ලේකම්තුමා වෙත යොමුකර ඇත.

09.ආශ්‍රිත වාර්තා / ලේඛන.

- වාර්ෂික වාර්තාව 2019, ජාතික තරුණ සේවා සභාව.
- මූල්‍ය වාර්තාව 2020, ජාතික තරුණ සේවා සභාව.
- ක්‍රියාත්මක සැලැස්ම 2020 ජාතික තරුණ සේවා සභාව.
- දිස්ත්‍රික් ප්‍රගති වාර්තා, ජාතික තරුණ සේවා සභාව.
- ජාතික තරුණ සේවා සභාව ප්‍රධාන කාර්යාලීය අංශ ප්‍රගති වාර්තා.
- භාණ්ඩාගාර /අමාත්‍යාංශ සංවර්ධන වියදම් වාර්තාව - 2020, ජාතික තරුණ සේවා සභාව.

ඇමුණුම 01

විගණක කමිටු වාර්තාව

විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම සම්බන්ධව නිකුත් කර ඇති චක්‍රලේඛ ප්‍රකාරව පැවැත්විය යුතු කමිටු සංඛ්‍යාව 4 ක් ලෙස නිර්ණය කර ඇති අතර, කොවිඩ් වසංගතය හේතුවෙන් 2020 වර්ෂයේ පැවැත්වීමට හැකිවූයේ කමිටු රැස්වීම් වාර 02 ක් පමණි.

අදාල රැස්වීම් පැවැත්වීමෙන් අනතුරුව ගන්නා ලද කමිටු තීරණ ඇතුලත් වාර්තාවන් සභා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියන් සඳහා ඉදිරිපත් කර ඇත. ගන්නා ලද කමිටු තීරණයන්හි සම්පින්ඩනයක් පහත දක්වා ඇත.

- රජයේ විගණන විමසුම් මගින් පෙන්වා දී ඇති අඩුපාඩු අවම කිරීම සඳහා කටයුතු කිරීම
- අභ්‍යන්තර විගණන හා විමර්ශන වාර්තා මගින් පෙන්වා දී ඇති අඩුපාඩු මග හරවා ගැනීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ නිරීක්ෂණ ලබාදීම
- ක්‍රියාත්මක කරනු ලැබූ සංවර්ධන වැඩසටහන් පිළිබඳව සමාලෝචනය
- ඉදිකිරීම් හා ප්‍රසම්පාදන ක්‍රියාවලීන් සම්බන්ධ
- සමස්ථ ඉඩම් හා දේපල පවරා ගැනීමේ පටිපාටිය පිළිබඳ ප්‍රගති සමාලෝචනය
- ආයතනික සේවක මණ්ඩල කටයුතු සම්බන්ධ සමාලෝචනය
- ආයතනික සංවර්ධන කටයුතු පිළිබඳ සමාලෝචනය
- වත්කම් භාරකාරත්වය හා භාණ්ඩ සමීක්ෂණ කටයුතු පිළිබඳ සමාලෝචනය
- වාර්ෂික ගිණුම් කටයුතු සම්බන්ධව
- ජාතික තරුණ සේවා සභාවට අනුබද්ධිත ආයතනයන්හි කටයුතු පිළිබඳ විමර්ශනයට ලක්කිරීම

ඇමුණුම 02 –

මූල්‍ය විගණක ප්‍රකාශය.



03

ජාතික තරුණ සේවා සභාව
මූල්‍ය තත්ත්වය ප්‍රකාශනය
2020-12-31 දිනට

(රු.000)

	උප. අංක	2020-12-31 දිනට	2019-12-31 දිනට
වත්කම්			
ජංගම වත්කම්			
මුදල් සහ මුදල් සමාන දෑ	01	29,436	1,158
ලැබිය යුතු දෑ	02	208,794	228,507
තොග	03	6,379	12,093
වෙනත් ජංගම වත්කම්	04	348	342
		244,957	242,100
වෙනත් මූල්‍ය වත්කම්			
ආයෝජන	05	1,799	1,799
කෙරීගෙන යන වැඩ	06	575,974	761,783
		577,773	763,582
ජංගම නොවන වත්කම්			
පිරියත හා උපකරණ	07	501,212	525,864
ඉඩම් හා ගොඩනැගිලි	08	2,064,903	1,829,463
බියුදේපල		-	533
ඉතිරි තොගය (පශු සම්පත්)	09	1,403	362
		2,567,518	2,356,222
මුළු වත්කම්		3,390,248	3,361,904
බැරකම්			
ජංගම බැරකම්			
ගෙවිය යුතු දෑ	10	137,123	205,812
වෙනත් බැරකම්	11	9,518	12,250
		146,641	218,062
ජංගම නොවන බැරකම්			
සාරධර්මමය වෙත් කිරීම්	12	497,361	494,928
මුළු බැරකම්		644,001	712,990
ශුද්ධ වත්කම්		2,746,246	2,648,914
ශුද්ධ වත්කම්/ ස්කන්ධය			
වෙනත් රාජ්‍ය අස්තිත්වයන්ගේ දායක වූ ප්‍රාග්ධනය	13	6,177,534	5,840,676
සංචිත	14	247,430	247,430
සමුච්චිත අතිරික්තය /(ඌනතාවය)		(3,678,718)	(3,439,192)
මුළු ශුද්ධ වත්කම් / ස්කන්ධය		2,746,246	2,648,914

ඒ. ගිලොකුගලප්පති
අධ්‍යක්ෂ (මූල්‍ය)
ජාතික තරුණ සේවා සභාව

තෙෂාර ජයසිංහ
සභාපති අධ්‍යක්ෂ/ජනරාල්
ජාතික තරුණ සේවා සභාව

ගිණුම්කරණ ප්‍රතිපත්ති පිටු අංක 01 සිට 02 දක්වා ද, ගිණුම්කරණ සටහන් පිටු අංක 05 සිට 14 දක්වා ද, ඇතුලත් මෙම මූල්‍ය ප්‍රකාශනය සකස් කිරීමේ හා ඉදිරිපත් කිරීමේ වගකීම සභාවේ කළමනාකරණ මණ්ඩලය විසින් දරනු ලැබේ. මෙම මූල්‍ය ප්‍රකාශනය කළමනාකරණ මණ්ඩලය වෙනුවෙන් අනුමත කර සහත අත්සන් යොදා මේ සමඟ ඉදිරිපත් කෙරේ.

01. ඒ. ඒ්‍ම්. ඒස්. ඒ්‍ත්තනායක - සභා අධ්‍යක්ෂ

02. - සභා අධ්‍යක්ෂ

ආයතන සාමූහික අක්ෂය සහාව
2020-12-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය තත්ත්වයෙහි ප්‍රකාශනය

විස්තරය	උප අංක	(රු.000) 2020.12.31	(රු.000) 2019.12.31
වත්කම්			
රජයේ දායකත්ව (ප්‍රත්‍යාවර්තනීය)		1,211,725	1,088,720
රජයේ දායකත්ව (අ-ප්‍රත්‍යාවර්තනීය)		199,958	440,523
		1,411,683	**1,529,243**
මාසික දායකත්ව (ප්‍රත්‍යාවර්තනීය)			
පළාත් සභා		208	120
මහජනයා හා රාජ්‍ය ආයතන (ප්‍රත්‍යාවර්තනීය)		63,392	499,490
විශේෂ අ-ප්‍රතිඵල		8,838	24,853
වෙනත් මාසික දායකත්ව		27,859	1,505
		1,511,979	**525,968**
අත්පත්කර ගැනීම්			
තාවකාලික සටහන්වලින් අදායම් (මතවාදී)	15	23,781	42,148
ප්‍රකාශ වටිනාකම්වල අදායම්	16	113,711	172,133
වීඩිට අදායම්	17	12,855	22,965
ප-අදායන අදායම්		823	5,891
ස්ථාවර වත්කම් ඉවත් කිරීම් ලාභය		35	2,272
අවසානය කිරීම අධි වෙනස්කිරීම්		135	340
සොඳිසියෙල් තාවකාලික ගිණුම්	18	5,533	
		156,873	**245,749**
		1,668,852	**2,300,960**
මෙහෙයුම් වියදම්			
අයිති සඳහා :-			
ආයතන හා පරිපාලන වැය	19	1,223,496	1,309,430
ස්ථාවර වත්කම් ක්ෂය		246,627	210,570
සොඳිසියෙල් තාවකාලික ගිණුම්			83
		(1,470,122)	(1,520,083)
		198,730	**780,877**
පරිපාලන අ-ප්‍රතිඵල වියදම්	19		
පරිගණක සැපයුම් හා අ-ප්‍රතිඵල අංශය	2-1	50,699	76,582
මාධ්‍ය අංශය	2-2	1,273	24,382
පරීක්ෂණ හා සැලසුම් අංශය	2-3	921	2,110
විශේෂිත මාර්ගගත්වයන හා උපදේශන අංශය	2-4	4,508	19,105
කාර්මික හා විශේෂිත ප්‍රකාශ අංශය	2-6	42,329	81,531
තාවකාලික පරිපාලන නවෝත්ත අංශය	2-7	4,929	4,055
ආයතනික පරිපාලන සම්බන්ධතා අංශය	2-8	8,053	15,096
අංශවල නිල්ලිණ අධිකාරී අංශය	2-9	770	10,768
ශ්‍රීඩා අ-ප්‍රතිඵල අංශය	2-10	66,423	84,853
පරිපාලන අ-ප්‍රතිඵල හා අ-ප්‍රතිඵල අංශය	2-11	8,814	67,847
ආදායම් පුප්‍රතිඵල හා සොඳිසියෙල් අ-ප්‍රතිඵල අංශය	2-12	9,787	12,650
පරිපාලන පළාත්පාල හා වියෝගය අ-ප්‍රතිඵල අංශය	2-13	999	3,966
නිල්ලිණ් විධිකාරී අංශය	2-14	2,007	6,405
ආයෝජන අංශය	2-15	1,344	4,734
අනාවරණ පාත්තරය අංශය	2-17	728	18,151
විශේෂ වියාපෘති අංශය	2-18	48,033	471,996
ඉවත් අංශය	2-19	6,897	1,088
ප්‍රකාශ ස්ථාවරයන්	2-6-1-2	115,596	166,340
තාවකාලික ස්ථාවරයන්ගේ - මතවාදී	2-6-1	22,627	39,845
		(396,736)	(1,111,504)
වර්ෂයේ අතිරික්තය/(දුෂණය)		(198,007)	(330,627)
අයකළ කළ :-			
වියදම් අතිරික්තය/(දුෂණය) (2020.01.01)		(3,439,193)	(3,072,994)
වසර වර්ෂ වියදම් සැලසීම		(41,518)	(35,571)
ඉදිරියට ගෙනා ශේෂය		(3,678,718)	(3,439,192)

ඇමුණුම් 03 - විගණකාධිපති වාර්තාව හා ජාතික තරුණ සේවා සභාවේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහාවූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව



ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } වීටීවයි/ඒ/එන්වයිඑස්සී/1/20/12 | ඔබේ අංකය / உமது இல. / Your No. } | දිනය / திகதி / Date } 2021 අප්‍රේල් 30 දින

සභාපති

ජාතික තරුණ සේවා සභාව

ජාතික තරුණ සේවා සභාවේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික තරුණ සේවා සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1

No. 306/72, Pelikaru Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 / 34 | +94 11 2 88 72 25 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

1.2 නත්න්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ජාතික තරුණ සේවා සභාවේ සියයට 98 ක කොටස් හිමිකාරත්වයක් ඇතිව, සී/ස ශ්‍රී ලංකා තරුණ සේවා සුද්ගලික සමාගම 1981 වර්ෂයේදී ආරම්භ කර නිබුණද ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබූ අතර සමාගම විසින් 2017 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශන සකස් කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 හි 99 ඡේදයට අනුව කාල පරිච්ඡේදය තුළ හඳුනාගත් සියළුම අදායම් හා වියදම් අයිතම ලාභ හෝ අලාභවල ඇතුළත් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයට අදාල සී/ස ශ්‍රී ලංකා තරුණ සේවා සුද්ගලික සමාගමට ගෙවිය යුතු එකතුව රු. 6,790,800 ක්වූ ආරක්ෂක වියදම් වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 65 ඡේදය ප්‍රකාරව, ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් ප්‍රවර්ථන වර්ෂය අවසානයට සම්පූර්ණයෙන් ක්ෂය කර නිබුණු පිරිවැය රු. 1,433,003,346 ක් වූ වත්කම් වර්ග 03 ක් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව, ඇතිවූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) 2019 වර්ෂය වන විට වැඩ නිමකර භාවිතයට ගෙන ඇති වටිනාකම රු. 17,934,286 ක් වූ ගොඩනැගිලි කෙරීගෙන යන වැඩ ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් ගොඩනැගිලි වටිනාකම අඩුවෙන් හා කෙරීගෙන යන වැඩ වටිනාකම වැඩියෙන් ද සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා නිබුණි. එසේම එම ගොඩනැගිලි වලට අදාල සමාලෝචිත වර්ෂයේ ක්ෂය රු. 896,714 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) සභාවට නීත්‍යානුකූල අයිතිය නිබූ අක්කර 04 පර්චස් 2.25 ක ප්‍රමාණයක් වූ ඉඩම් 05 ක වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

(ඊ) සභාවේ මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය අවසානයට සීමාසහිත ශ්‍රී ලංකා තරුණ සේවා සුද්ගලික සමාගම වෙත ගෙවිය යුතු ශේෂය ලෙස රු. 836,790 ක් දක්වා නිබුණ ද සමාගම විසින් විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව එදිනට සභාවෙන් අයවිය යුතු ශේෂය රු. 79,713,942 ක් වූයෙන් රු. 78,877,152 ක නොසැසඳීමක් විය.

(ඇ) මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ කෙරීගෙන යන වැඩ වලින් ජනිත වූ මුදල් ප්‍රවාහක් ලෙස රු. 185,808,765 ක් දක්වා තිබුණද කෙරීගෙන යන වැඩ සඳහා තථ්‍ය වශයෙන් උපයෝජනය කර තිබුණු මුදල් රු. 149,929,102 ක් විය. ඒ අනුව කෙරීගෙන යන වැඩ සඳහා වූ මුදල් ප්‍රවාහයේ රු. 335,737,868 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර එම වෙනස කෙරීගෙන යන වැඩ ගිණුමෙන් ස්ථාවර වත්කම් ගිණුමට මාරුකරන ලද රු. 335,737,868 ක මුදල වර්ෂයේ ස්ථාවර වත්කම් මිලදී ගැනීම් සඳහා උපයෝජනය කළ මුදලක් ලෙස දෝෂ සහිතව මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ දක්වා තිබුණි.

(ඈ) 2019 සැප්තැම්බර් මාසයේ දී සුගතදාස ක්‍රීඩාංගනයේ පැවැත්වීමට සැලසුම් කර තිබූ 31 වෙනි ජාතික යෞවන ක්‍රීඩා උළෙල සඳහා සුගතදාස ක්‍රීඩාංගනය වෙන්කරගැනීම වෙනුවෙන් ගෙවන ලද රු. 2,293,734 ක මුදල එම ක්‍රීඩා උත්සවය නොපැවැත්වීම හේතුවෙන් ලැබිය යුතු ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට නිසිදු තහවුරු කර ගැනීමකින් තොරව වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

1.3 සභාවේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන ජාතික තරුණ සේවා සභාවේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

සභාවේ 2020 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබෙ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරන ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සභාව ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් නැවීම හා සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සභාවේ මූල්‍ය වාර්තාකරන ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්,වියදම්,වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එම ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන

බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, විනාස ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරීක්ෂා සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් නිශේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය නිරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සම්ස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සභාව පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව (ආ) හා (ඇ) හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ආයතනය සම්බන්ධ වී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අනාගාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ යම් අදාල ලිඛිත නීතියකට හෝ සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද චෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීති, රීති, රෙගුලාසිවලට යොමුව	නිරීක්ෂණ
1999 ජූනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛය	අමාත්‍ය මණ්ඩලය, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ හෝ භාණ්ඩාගාරය විසින් නිශ්චිතවම අනුමත කරන ලද ප්‍රතිලාභ පමණක් තම පාලක මණ්ඩලවල අනුමැතිය ඇතිව සිය සේවකයන්ට ගෙවීමට හැකියාව තිබුණද ඊට පටහැනිව ක්‍රීඩා සමාජයේ කටයුතු කිරීම වෙනුවෙන් නිලධාරීන් පස් දෙනෙකුට 2019 ජනවාරි සිට 2020 ජනවාරි දක්වා එකතුව රු. 228,900 ක් ගෙවා තිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාවේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර සභාවේ සමීපත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර ඇත්තා කර නොමැති බව.

2.3 වෙනත් කරුණු

(අ) 2015 වර්ෂයේ සිට බාහිර ආයතන 04 කින් ලබාදී තිබූ එකතුව රු. 4,959,409 ක අරමුදල් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට අදාල කාර්ය සඳහා උපයෝජනය කර නොතිබුණි.

(ආ) ජාතික තරුණ සේවා සභාව මගින් ක්‍රියාත්මක කරන ලද ඉදිකිරීම් කොන්ත්‍රාත් 16 කට අදාලව ප්‍රමාණ පත්‍රිකාවේ ගෙවීම් කිරීමේ ක්‍රමවේදය අනුව "අදාල ලේඛන භාරදීමෙන් පසුව එම රක්ෂණාවරණ සහ සුරක්ෂණ හා බැඳුම්කර ලබාගැනීමට දරන ලද සතය පිරිවැය මත සියයට 5 ක වටිනාකමක් එකතු කර ගෙවීම් කිරීම" ලෙස සඳහන් කර ඇතත් එය නොසලකා හරිමින් කොන්ත්‍රාත්කරුවාගේ ශ්‍රමිකයන් සඳහා වන වන්දි රක්ෂණාවරණය සඳහා එකතුව රු. 1,147,245 ක් වැඩිපුර ගෙවා තිබූ අතර කොන්ත්‍රාත්කරුගේ ලංසු වටිනාකම් මත එකතුව රු. 4,253,750 ක් ගෙවා තිබුණි.

(ඇ) 2017 වර්ෂයේදී ඉදිකිරීම් ව්‍යාපෘති 2 ක් සඳහා සැලසුම් සකස් කිරීම සඳහා රු. 2,613,779 ක් වැයකර තිබුණද 2020 දෙසැම්බර් 31 දින වන විටත් එම ඉදිකිරීම් ආරම්භ කර නොතිබුණි.

(ඈ) පිරිවැය රු. 62,942,058 ක් වැයකර (අවසන් ගෙවීම හැර) ඉදිකරන ලද මහරගම තරුණ සේවා මධ්‍යස්ථානයේ පිහිනුම් තටාකයට අදාල පළමුව තෝරාගත් උපදේශක ආයතනය මඟින් අදාළ කාර්යය ඉටුකර නොගැනීම් හේතුවෙන් වෙනත් උපදේශක ආයතනයක් මඟින් එම කාර්යය ඉටුකර ගැනීම හේතුවෙන් රු. 2,870,400 ක් වැඩිපුර ගෙවීමට සිදුවී තිබුණි.

ඩබ්ලිව්. ඒ. සී. වික්‍රමරත්න
විගණකාධිපති

ඇමුණුම 04 - ජාතික කරුණා සේවා සභාවේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ එහි කටයුතු පිලිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණකාධිපති වාර්තාව සම්බන්ධ ප්‍රගතිය.

විගණන නිරීක්ෂණය	වර්තමාන තත්ත්වය
1.2 මතය සඳහා පදනම	
(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 හි 99 ඡේදයට අනුව කාල පරිච්ඡේදය තුළ හඳුනාගත් සියළුම අදායම් හා වියදම් අයිතම ලාභ හෝ අලාභවල ඇතුළත් කළ යුතු වුවද, සී/ස ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගමට ගෙවිය යුතු 2020 දෙසැම්බර් මාසයට අදාල එකතුව රු. 6,790,800 ක්වූ ආරක්ෂක වියදම් වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.	සී/ස ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගමට ගෙවිය යුතු ආරක්ෂක වියදම් සඳහා වූ වටිනාකම ගිණුම් සකස් කර අවසන් කරන අවස්ථාව වන විට නිශ්චිතවම හඳුනාගැනීමට නොහැකි වූ නිසා උපචිත වියදම් ගිණුම්ගත කිරීමට නොහැකිවිය. ඉදිරියේදී මෙම විභදම්ද කල්වේලා ඇතිව හඳුනාගෙන උපචිත වියදම් ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු කර ඇත.
(ආ)ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 65 ඡේදය ප්‍රකාරව, ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් ප්‍රවර්ථන වර්ෂය අවසානයට සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණු පිරිවැය රු. 1,276,008,338 ක් වූ ගොඩනැගිලි ඒකක 506 ක්, පිරිවැය රු. 62,729,259 ක් වූ ලී බඩු උපකරණ ඒකක 28204 ක් හා පිරිවැය රු. 94,265,749 ක් වූ යන්ත්‍රෝපකරණ ඒකක 1785 ක් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව, ඇතිවූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. තවද එහි දළ ධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 07 අනුව වත්කම් ප්‍රත්‍යාගණනය කර ඉදිරියේදී දළ ධාරණ අගය හෙළිදරව් කිරීමට කටයුතු කරනු ලැබේ.
1.5.3.ගිණුම්කරණ අඩුපාඩු (අ) 2019 වර්ෂය වන විට වැඩ නිමකර, පරිහරණය කරමින් පවතින එකතුව රු. 17,934,286 ක් වූ ගොඩනැගිලි වටිනාකම කෙරීගෙන යන වැඩ ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් ගොඩනැගිලි වටිනාකම අඩුවෙන් හා කෙරීගෙන යන වැඩ වටිනාකම වැඩියෙන් ද ඊට අදාලව සමාලෝචිත වර්ෂයේ ක්ෂය රු. 896,714 ක් අඩුවෙන් ද දක්වා තිබුණි.	2021 වර්ෂයේදී නිවැරදිව දැක්වීමට කටයුතු කරනු ලැබේ.

(ආ) සභාවට නීත්‍යානුකූල අයිතිය තිබූ අක්කර 04 පර්චස් 2.25 ක ප්‍රමාණයක් වූ ඉඩම් 05 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.	විමසුමේ දක්වා ඇති ඉඩම් 5න් උඟව පළාත් කාර්යාලය හා බදුල්ල දිස්ත්‍රික් කාර්යාලය පිහිටි ඉඩමට අදාල තක්සේරු වාර්තාව මේ වන විට ලැබී ඇත.ඒ අනුව එම වටිනාකම 2021 වර්ෂයේ ගිණුම් ගත කිරීමට මේ වන විට කටයුතු කර ඇත.ඊට අදාල ජ'නල් සටහන හා තක්සේරු වාර්තා ඇමුණුම 01 ලෙස මේ සමඟ ඉදිරිපත් කරමි.ඉතිරි ඉඩම් සඳහා තක්සේරු වාර්තා 2021 වර්ෂය තුල ලබා ගෙන ගිණුම් ගත කිරීමට කටයුතු කරන ලෙස අදාල නිලධාරීන්ට මා විසින් උපදෙස් දී ඇත.
(ඇ) මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ කෙරීගෙන යන වැඩ ලෙස රු. 185,808,765 ක මුදල් ගලා ඒමක් සටහන් කර තිබුණද කෙරීගෙන යන වැඩ ලෙජර් ගිණුම පරීක්ෂා කිරීමේදී රු. 149,929,102 ක මුදල් ගලා යාමක් වර්ෂය තුළ සිදුවී ඇති බව නිරීක්ෂණය විය. ඒ අනුව කෙරීගෙන යන වැඩ ගිණුම මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ සටහන් කිරීමේදී රු. 335,737,868 ක වෙනසක් සිදුවී තිබුණි. එසේම කෙරීගෙන යන වැඩ ගිණුමෙන් ස්ථාවර වත්කම් ගිණුමට මාරුකර තිබූ රු. 335,737,868 ක මුදල වර්ෂයේ ස්ථාවර වත්කම් මිලදී ගැනීම් ලෙස මුදල් ගලා යාමක් ලෙස දක්වා තිබුණි.	වක්‍ර ක්‍රමයට මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කිරීමේදී මූල්‍යමය නොවන වෙන් කිරීම් හැර අනෙකුත් සියළු අගයන් සැලකිල්ලට ගැනීම සිදුකරන ලබයි.ඒ අනුව මෙම ගැලපීම සිදු කර ඇත.
(ඈ) 2019 සැප්තැම්බර් මාසයේ දී සුගතදාස ක්‍රීඩාංගනයේ පැවැත්වීමට සැලසුම් කර තිබූ 31 වෙනි ජාතික යෞවන ක්‍රීඩා උළෙල සඳහා සුගතදාස ක්‍රීඩාංගනය වෙන්කරගැනීම වෙනුවෙන් රු. 2,293,734 ක් 2019 වර්ෂයේ ගෙවා තිබුණ ද එම ක්‍රීඩා උත්සවය නොපැවැත්වීම හේතුවෙන් එම මුදල ලැබිය යුතු මුදලක් ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට වර්ෂයෙ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.	2021 වර්ෂයේදී පැවැත්වීමට නියමිත 33 වන ජාතික යෞවන ක්‍රීඩා උළෙල සඳහා දැරීමට අපේක්ෂිකත වියදම් තුළින් මෙතෙක් ගෙවා ඇති මුදල හිලව් කර ගැනීමට මේ වන විටත් සුගතදාස ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ නිලධාරින් සමඟ සාකච්ඡා කර එකඟතාවයකට පැමිණ ඇත. යම් හෙයකින් මෙම ක්‍රීඩා උළෙල මෙහි පැවැත්වීමට නොහැකි වුවහොත් මෙම මුදල අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ.
1.5.4 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා සභාවේ මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය අවසානයට සීමාසහිත ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගම වෙත ගෙවිය යුතු ශේෂය ලෙස රු. 836,790 ක් දක්වා තිබුණ ද සමාගම විසින් විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව එදිනට සභාවෙන් අයවිය යුතු ශේෂය රු. 79,713,942 ක් විය. ඒ අනුව එම ශේෂයන් දෙක අතර රු. 78,877,152 ක වෙනසක් නිරීක්ෂණය විය.	සීමා සහිත තරුණ සේවා සමාගම සඳහා ගෙවිය යුතු වියදම් ලෙස ගිණුම් පිළියෙල කරනු ලබන අවස්ථාවේදී හඳුනාගත හැකි වූයේ රු.836,790.00 ක මුදලක් පමණි.විමසුමේ දක්වා ඇති පරිදි සී/ස තරුණ සේවා සමාගමේ ගිණුම් වල දක්වන ශේෂයන් හා ජාතික තරුණ සේවා සභාවේ වටිනාකම හා නොගැලපීමක් තිබෙන බව පසුගිය වර්ෂ කිහිපයකදී හඳුනාගෙන තිබුනත් එම වටිනාකම සැසඳීම් කර ගැනීමට අපහසු වී ඇති බව දන්වනු කැමැත්තෙමි. කරුණු එසේ හෙයින් 2020 වර්ෂයේ සිට ගෙවිය යුතු ගෙවීම් නිරවුල් කිරීම සඳහා නියමිත පරිදි අදාල බිල්පත් ඉදිරිපත් කරන ලෙස තරුණ සේවා සමාගම වෙත උපදෙස් ලබා දී ඇත. ඒ තුළින් 2020 වර්ෂයේ සිට ආයතන දෙක අතර පවත්නා ශේෂ නොගැලපීම් වළක්වා ගැනීමට

	හැකිවනු ඇත.
1.5.5 ඒකාබද්ධ කිරීම ජාතික තරුණ සේවා සභාවේ සියයට 98 ක කොටස් හිමිකාරත්වයක් ඇතිව, සී/ස ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගම 1981 වර්ෂයේදී ආරම්භ කර තිබුණද ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබූ අතර සමාගම විසින් 2017 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශන සකස් කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.	සීමාසහිත ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගම මේ වන විට ගිණුම් සකස් කර ජාතික තරුණ සේවා සභාව වෙත ඉදිරිපත් කර ඇත්තේ 2017.12.31 දින දක්වා පමණි. ඒ හේතුවෙන් 2020.12.31 දිනට ජාතික තරුණ සේවා සභාව විසින් සකස් කරන ලද මූල්‍ය වාර්තාවට තරුණ සේවා සමාගමේ ගිණුම් ඒකාබද්ධ කිරීමට නොහැකි වී ඇත.2020.12.31 දිනට ගිණුම් පිලියෙල කර 2021.01.29 දිනට ප්‍රථම ලබා දෙන ලෙස දන්වා ඇත.නමුත් ඔවුන් විසින් මූල්‍ය වාර්තාව ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ජාතික තරුණ සේවා සභාවේ මූල්‍ය වාර්තාවට ඒකාබද්ධ කර ඉදිරිපත් කිරීමට නොහැකි වූ බව දන්වමි.
1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම් 1.6.1 ගෙවිය යුතු මුදල් 2020 දෙසැම්බර් 31 දිනට කොන්ත්‍රාත් රඳවා ගැනීමේ ගිණුමේ තුළ වසර 05 කට අධික කාලයක් තිස්සේ පවතින එකතුව රු. 3,258,560 ක් වූ ශේෂය සහ වසර 03 කට වඩා පැරණි එකතුව රු. 1,873,036 ක් වූ විවිධ ණයහිමි ශේෂයන් නිරවුල් කරලීම සඳහා ආයතනය ප්‍රමාණවත් පියවර ගෙන නොමැති බවත් නිරීක්ෂණය විය.	නිල්වලා තුරුණු උයන ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවට හා උතුරු පළාතේ පුනගරීන් ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවට අදාල රඳවා ගැනීම් නිදහස් කිරීමට අවශ්‍ය මුදල් නොමැති වීම නිසා ශේෂය නිරවුල් කිරීමට නොහැකි වූ අතර රත්මලාන පුහුණු මධ්‍යස්ථානය නවීකරණයට අදාල රඳවා ගැනීම් ශේෂය නිරවුල් කිරීමට නොහැකි වූයේ එම ඉදිකිරීම්කරු සම්බන්ධයෙන් බේරුම්කිරීමේ නඩුවක් පවතින බැවිනි.
1.7 නීති , රීති රෙගුලාසි සහ කළමනාකරණ තීරණය ආදියට අනුකූල නොවීම නීති, රීති, රෙගුලාසිවලට යොමුව --- (ආ) 1999 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛය අමාත්‍ය මණ්ඩලය, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ හෝ භාණ්ඩාගාරය විසින් නිශ්චිතවම අනුමත කරන ලද ප්‍රතිලාභ පමණක් තම පාලක මණ්ඩලවල අනුමැතිය ඇතිව සිය සේවකයන්ට ගෙවීමට හැකියාව තිබුණද ඊට පටහැනිව ක්‍රීඩා සමාජයේ කටයුතු කිරීම වෙනුවෙන් නිලධාරීන් පස් දෙනෙකුට 2019 ජනවාරි සිට 2020 ජනවාරි දක්වා එකතුව රු. 228,900 ක් ගෙවා තිබුණි.	ක්‍රීඩා සමාජයේ එයකට සිටි නිලධාරීන් විසින් මෙම වැයදැරීම් සිදු කර ඇති අතර මේ පිළිබඳව සලකා බැලීමෙන් අනතුරුව ප්‍රතිසංවිධාන කටයුතු සිදු කිරීම සඳහා කමිටුවක් පත් කර ඇති අතර දැනටමත් ඉතා ඉක්මණින් කලහැකි ප්‍රතිසංවිධාන කටයුතු ක්‍රියාත්මක කරමින් පවති. කමිටු නිර්දේශ ලද පසු අවශ්‍ය සංශෝධන සිදුකිරීමට පියවර ගන්නා බව දන්වා සිටිමි.

03.මෙහෙයුම් සමාලෝචනය	
3.1 අනාර්ථික ගනුදෙනු	
(අ)සමාලෝචිත වර්ෂය තුළ ඉවත් කිරීමට යෝජිත භාණ්ඩ ලෙස සමීක්ෂණ මණ්ඩලය විසින් තීරණය කර තිබූ තොගය තුළ 2017 වර්ෂය තුළ මුද්‍රණය කර තිබූ තරුණ තොරතුරු පත්‍රිකා 280,000 න් 268,000 ක් පැවති අතර එහි පිරිවැය වටිනාකම රු. 1,822,400 ක් විය. මෙලෙස රාජ්‍ය මුදල් අරපිරිමැසුම්දායක ලෙස හා ඵලදායීව යොදා නොගැනීම සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි අංක 156 අනුව අදාල වගකිවයුතු නිලධාරීන් හඳුනාගෙන රජයට සිදුවූ පාඩුව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	අත්පත්‍රිකා සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන අංශය මඟින් පරීක්ෂාවක් සිදු කර ඒ අනුව ඉදිරි කටයුතු සිදු කරනු ලබන බව සඳහන් කරමි.
3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා	
සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මගින් හෙලිදරව් කරන ලද සභාව විසින් භුක්ති විඳිනු ලබන ඉඩම් 40 ක අයිතිය පවරාගැනීමට සභාව අපොහොසත් වී තිබුණි	සභාව විසින් භුක්ති විඳින ඉඩම් 40 ට අදාල පවරා ගැනීම් සඳහා වන කටයුතු කිරීම් අබන්ඩව සිදු කරගෙන යන අතර, එම ක්‍රියාවලිය ඉතා අපහසු ක්‍රියාවලියන් වන බැවින් පවරා ගැනීම් කටයුතු කඩිනමින් කර ගැනීම ඉතා අපහසු කරුණක් බව සඳහන් කරමි.කෙසේ වෙතත් මෙම ඉඩම් පවරා ගැනීම සඳහා රජයේ පවත්නා නීති රීති වලට අනුවකූලව පවරා ගැනීම් කටයුතු නොකඩවා සිදු කරමින් පවතී.
3.3 අරමුදල් ඌණුපයෝජනය	
2015 වර්ෂයේ සිට බාහිර ආයතන 04 කින් ලබා දී තිබූ එකතුව රු.4,954,409 ක අරමුදල් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 වන විට අදාල කාර්යය සඳහා උපයෝජනය කර නොතිබුණි .	අභ්‍යන්තර විගණන අංශය විසින් මෙම කරුණ සම්බන්ධයෙන් සිදු කරන ලද විමර්ශනයේදී මෙම ප්‍රසම්පාදන කටයුතු රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වලට අනුකූලව සිදු කර ඇද්ද යන්න පරීක්ෂා කර ඇති අතර කරන ලද දීර්ඝ විමර්ශනයට අනුව ඉදිරිපත් කර ඇති එම වාර්තාවේ නිර්දේශ සලකා බලා ඉදිරි පියවර ගැනීම සඳහා නීති අංශය වෙත යොමු කර ඉදිරි කටයුතු සිදු කරනු ඇත. මෙම අරමුදල් භාවිතා කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ (මුදල්) විසින් පසුගිය වර්ෂ වලට අදාල මුදල් පොත් හා බැංකු ප්‍රකාශ දීර්ඝ වශයෙන් පරීක්ෂා කර ඇති අතර එහිදී භාණ්ඩාගාරයේ අක් මුදල් ලැබීම් වල ප්‍රමාද වීම් හා සීමාවන් හේතුවෙන් සභාවේ හදිසි අවශ්‍යතා සඳහා වියදම් දැරීමට එම අරමුදල් භාවිතා කර ඇති බව සොයාගෙන ඇත. මෙහිදී එම හදිසි අවශ්‍යතා වියදම් දැරීම අනිවාර්ය හා කල් දැමිය නොහැකි තත්ත්වයන් මත සභාවේ කාර්යයන් කාර්යක්ෂමව පවත්වාගෙන යාම සඳහා කටයුතු කර ඇති බව පෙනේ.

	තවද මෙම කාල වකවානුව තුල නිසි පරිදි භාණ්ඩාගාර අක්මුදල් ලැබීම් සිදු වී නොමැති බවට වාර්තා වී ඇති අතර ඒ නිසා උක්ත බාහිර පාර්ශවයන්ගේ ලැබීම් වලින් කරන ලද වියදම් ප්‍රතිපූර්ණය කර ගැනීමට නොහැකි වී ඇති බව වාර්තා කරමි. තවදුරටත් මේ සම්බන්ධයෙන් විෂය භාරව කටයුතු කල නිලධාරිණිය කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් මිය ගොස් ඇත. එම නිසා මේ පිළිබඳව ක්‍රියා මාර්ගගැනීමට අපහසු තත්ත්වයක් මතු වී ඇත . නමුත් මේ සම්බන්ධව දීර්ඝ වශයෙන් සාකච්ඡා කර ඉදිරියේදී මෙවැනි සිදු වීම් සිදු නොවීමට වගබලා ගනු වස් අවශ්‍ය අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් දැනටමත් ගිණුම් අංශයේ ගිණුම් නිලධාරින් වෙත හඳුන්වා දීමට පියවර ගෙන ඇත. ඒ අනුව ඉදිරියේදී මෙවැනි දුර්වලතා නැති කර ගැනීමට හැකි බව පෙන්වා දෙමි.
3.4 ව්‍යාපෘති හා ප්‍රාග්ධන වැඩප්‍රමාදයන්	
(අ) සභාව විසින් 2017 වර්ෂයේදී ඉදිකිරීම් ව්‍යාපෘති 2 ක් සඳහා සැලසුම් සකස් කිරීම සඳහා එකතුව රු. 2,613,779 ක් වැයකර තිබුණද 2020 දෙසැම්බර් 31 දින වන විටත් ඉදිකිරීම් ආරම්භ කර නොතිබුණි.	ව්‍යාපෘති අනුමැතිය ලබා 2017 වර්ෂයේ වෙන්වූ ප්‍රතිපාදන තුළින් බෙරුවල හා පිළියන්දල පුහුණු මධ්‍යස්ථාන ඉදිකිරීමට අදාළ සැලසුම් ඇස්තමේන්තු හා පස් පරීක්ෂාව ඉටු කර අවසන් කර ඇත. නමුදු අවශ්‍ය ප්‍රතිපාදන මේ වනතෙක් නොලැබීම නිසා ඉදිකිරීම් ආරම්භ කිරීමට නොහැකි වුනි. භාණ්ඩාගාරයෙන් ප්‍රතිපාදන වෙන්වූ පසු මේ සඳහා ප්‍රමුඛතාවය ලබා දීමට ඉටු කරන බව දැනුම් දෙමි.
(ආ) සමාලෝචිත වර්ෂය අවසන් වන විට ආංශික නිපුණතා සංවර්ධන වැඩසටහන යටතේ රු. 84,216,614 ක් වැයකර තිබූ ව්‍යාපෘති 2 ක් කොන්ත්‍රාත්කරු විසින් වැඩ ප්‍රමාද කිරීම හේතුවෙන් 2018 අගෝස්තු සිට වැඩ නවතා දැමීමට කටයුතු කර තිබූ අතර එම ඉදිකිරීම් සම්බන්ධයෙන් නැවත වැඩ ආරම්භ කිරීමක් සිදුකර නොතිබුණි.	ආංශික නිපුණතා සංවර්ධන වැඩසටහන මගින් ඉතිරි මුදල් නොලැබීම නිසා ලව්ලේන් හා දඹුල්ල පුහුණු මධ්‍යස්ථාන ඉදිකිරීමේ ඉතිරි කොටස ආරම්භ කිරීමට නොහැකි වුනි. ඉදිරියේදී මේ සඳහා ප්‍රමුඛතාවය ලබා දී කාර්යය ඉටුකරන බව දැනුම් දෙමි.
(ඇ)සමාලෝචිත වර්ෂය අවසන් වන විට ක්‍රියාත්මක කරමින් පවතින ඉදිකිරීම් ව්‍යාපෘති 06 ක් සඳහා රු. මිලියන 372.75 ක් වැයකර තිබූ අතර එම ව්‍යාපෘතිවල ඉදිකිරීම් සම්බන්ධව ඇතිකරගත් ගිවිසුම් අනුව වැඩ අවසන් කළ යුතු කාලය අවසන් වී වසරකටත් අධික කාලයක් ගතවී ඇතත් එම ව්‍යාපෘතිවල භෞතික ප්‍රගතිය සියයට 13 සිට සියයට 61 දක්වා පහල මට්ටමක පවතින බව නිරීක්ෂණය විය.	විමසුමේ සඳහන් ඉදිකිරීම් ව්‍යාපෘති හත (07) 2017 හා 2018 වර්ෂයේ ආරම්භ කරන ලද ව්‍යාපෘති වේ. මේ වන විට ප්‍රගතිය පහත පරිදි වේ. <u>ව්‍යාපෘතිය</u> <u>දැනට භෞතික ප්‍රගතිය</u> 1. හලාවත පුහුණු මධ්‍යස්ථාන ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම 65% 2. නුවරඑළිය සංචාරක ගොඩනැගිල්ල ඉදිකිරීම 53% 3. බෙල්වුඩ් පුහුණු මධ්‍යස්ථානය නවීකරණය අදියර 1 70% 4. පොල්ගොල්ල පන්ති කාමර ගොඩනැගිල්ල ඉදිකිරීම 63% 5. බෙල්වුඩ් පුහුණු මධ්‍යස්ථානය නවීකරණය අදියර 11 21% 6. මහරගම ගබඩාව, රියදුරු 7. නේවාසිකාගාරය ඉදිකිරීම අවසන් 100%

	8. මොණරාගල පන්ති කාමර ගොඩනැගිල්ල ඉදිකිරීම 58% මහරගම ගබඩාව හා රියදුරු නේවාසිකාගාර ගොඩනැගිල්ල මේ වන විට සාර්ථකව අවසන් කර ඇත. මෙම ව්‍යාපෘති වල 2018 සැප්තැම්බර් සිට ඉදිරිපත් වූ බිල්පත් වලට මුදල් ගෙවීමට නොහැකි වීම හා Covid 19 වෛරසය තත්වය නිසා ඇති වූ බාධාවන් නිසා නියමිත ප්‍රගතියක් ලබා ගැනීමට නොහැකි වී ඇත. ගෙවීමට ඉදිරිපත්ව තිබූ රු. මිලි. 123 කට අදාල බිල්පත් (ඇමුණුම් අංක 02) 2020 දෙසැම්බර් ගෙවීමට හැකියාව ලැබුණි. එහෙත් හලාවත පුහුණු ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණ කොන්ත්‍රාත්තුවට ඉදිරිපත් වූ 5,6 හා 7 බිල්පත් වලට අදාල රු.මිලි. 20.95 ක මුදල මේ වනතෙක් ගෙවීමට නොහැකි වී ඇත. එබැවින් මෙම කොන්ත්‍රාත්තුව ගිවිසුම් ප්‍රකාරව තාවකාලිකව නතර කර ඇත. අනෙකුත් ඉදිකිරීම් ව්‍යාපෘති පහ (05) මෙ වන විට සාමාන්‍ය ප්‍රගතියක් ඉටුවෙමින් පවතී. ප්‍රතිපාදන අඛණ්ඩව නොලැබීම කාර්යය සාර්ථක ප්‍රගතියකින් අවසන් කර ගැනීමට විශාල බාධාවක් වී ඇත. පසුගිය වසර 10 තුල ඉදිකිරීම් පිලිබඳව සමාලෝචනයක් සිදු කිරීමට පියවර ගැනීමට අපේක්ෂා කෙරේ.
3.5 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු සභාව මගින් ක්‍රියාත්මක කරන ලද ඉදිකිරීම් කොන්ත්‍රාත් 16කට අදාලව ප්‍රමාණ පත්‍රිකාවේ ගෙවීම් කිරීමේ ක්‍රමවේදය ‘‘අදාල ලේඛන භාරදීමෙන් පසුව එම සුරක්ෂණ හා බැඳුම්කර ලබාගැනීමට දරන ලද සත්‍ය පිරිවැය මත සියයට 5 ක වටිනාකමක් එකතුකර ගෙවීම් කිරීම’’ යනුවෙන් සඳහන් කර ඇතත් සුරක්ෂණ හා බැඳුම්කර එය නොසලකා හරිමින් කොන්ත්‍රාත්කරුවාගේ ශ්‍රමිකයන් සඳහා වන වනදි රක්ෂණාවරණය සඳහා එකතුව රු.1,147,245 ක් වැඩිපුර ගෙවා තිබුණි.තවද කොන්ත්‍රාත්කරුගේ ලංසු වටිනාකම මතද එකතුව රු.4,253,750 ක් ගෙවා තිබුණි.	මේ පිළිබඳව 2021/03/30 දින පැවති අමාත්‍යාංශ විගණන කළමණාකරණ කමිටුවේද විමසුමට ලක් කරන ලදී. විමසුමේ සඳහන් සෑම ඉදිකිරීම් ව්‍යාපෘතියකටම අදාලව කොන්ත්‍රාත් ගිවිසුම් මගින් දෙපාර්ශවය ගිවිසගත් අයිතමයට අදාළ මිල වටිනාකම පමණක් ගෙවීම් කර ඇත. ගෙවීම් ක්‍රමවේදයේ නිවැරදිතාවය වැඩිදුරටත් තහවුරු කර ගැනීම සඳහා 2021/03/29 දින ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ (උපදේශක සේවා) වෙත ලිපියක් යොමු කරන ලදි.
පිරිවැය රු. 62,942,058 ක් වැයකර (අවසන් ගෙවීම හැර) වැය කර ඉදිකරන ලද මහරගම තරුණ මධ්‍යස්ථානයේ පිහිනුම් තටාකයට අදාලව පළමුව තෝරාගත් උපදේශක ආයතනය මඟින් අදාල කාර්යය ඉටු කර නොගැනීම හේතුවෙන් වෙනත් උපදේශක	පිහිනුම් තටාකය ඉදිකිරීමට උපදේශකත්වය සැපයීම සඳහා ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීම් මගින් තරගකාරිත්වයක් තුලින් තෝරා ගන්නා ලද පළමු උපදේශක ආයතනය සකස් කරන ලද සැලසුම්, ඇස්තමේන්තු හා ටෙන්ඩර් ලේඛණ වල පැවති අඩුපාඩු තාක්ෂණික ඇගයීම් කමිටුව පෙන්වා දීම පිලිනොගැනීම නිසා පැන නැගුණු තාක්ෂණික

ආයතනයක් මඟින් එම කාර්යය ඉටු කර ගැනීම හේතුවෙන් රු. 2,870,400 ක් වැඩිපුර ගෙවීමට සිදු වී තිබුණි.	අවධානම් තත්වය හේතු කොට ගෙන උපදේශන සේවා මාර්ගෝපදේශ සංග්‍රහයේ සඳහන් standard conditions of engagement part I & II – ICTAD CONSULT 01 හි වගන්ති 2:10 ට අනුව ඉවත් කිරීම් කටයුතු සිදු කර , එහිම වගන්ති 2:10:5 අනුව ඒ දක්වා ඉටු කරන ලද සේවා සඳහා ගෙවා අවසන් කරන ලදී. ඉන් අනතුරුව ඉතිරි උපදේශන වැඩ කොටස් නිම කරගැනීම සඳහා ඉහත සඳහන් කල මාර්ගෝපදේශ වලට අනුකූලව නව ආයතනයතක් පත් කරගැනීමට කටයුතු කරන ලදී. ලොව පුරා ඇති වූ Covid 19 වෛරස තත්වය හේතු කොට, පිහිනුම් තටාක පුහුණු වීම් සිදු කිරීමට අවසර නොලැබුණි. සීමිත කණ්ඩායම් වශයෙන් පුහුණු වීම් කිරීමට අවසර ලබා ගැනීමෙන් අනතුරුව සෞඛ්‍ය ආරක්ෂක ක්‍රමවේදය අනුගමනය කරමින් පුහුණු වීම් වලට විවෘත කිරීමට නියමිතය.
මානව සම්පත් කළමනාකරණය	
(අ) ආයතනය තුළ සිවිල් ඉංජිනේරුවරයකු සඳහා අනුමත තනතුරක් පැවතියද ඒ සඳහා සුදුසුකම් ලත් නිලධාරියකු බඳවාගැනීමටද කටයුතු කිරීමෙන් තොරව 2017 සිට 2020 දක්වා කාලය තුළ සභාව විසින් ව්‍යාපෘති 20 ක් ඉදිකිරීම සඳහා ඉදිකිරීම් ව්‍යාපෘති අධීක්ෂණ හා සැලසුම් කිරීම වෙනුවෙන් උපදේශක ආයතනවලට එකතුව රු. 36,182,728 ක් ගෙවීම් කර තිබුණද ඉදිකිරීම් කටයුතු නියමිත කාල රාමු තුළ නිම කරවා ගැනීමට කටයුතු කර නොතිබුණි.	මේ වන විට පුරප්පාඩුව සඳහා සිවිල් ඉංජිනේරුවරයකු බඳවා ගැනීමට කටයුතු කර ඇත.
(ආ) අනුමත සේවක සංඛ්‍යාව 1449 ක් වුවද , එදිනට පුරප්පාඩු තනතුරු 294 ක් වූ අතර ඉන් මාණ්ඩලික තනතුරු 35 ක් වසර 03 කට අධික නොමැත. කාලයක සිට පුරප්පාඩු පැවතිණි.	දැනට පුරප්පාඩු පවතින සියලුම තනතුරු සඳහා බඳවා ගැනීම් කිරීම උදෙසා අභ්‍යන්තරව හා බාහිරව අයදුම්පත් කැඳවා ඉදිරි කටයුතු සිදු කරමින් පවතී.
04 ගිණුම් කටයුතු බාවය සහ යහපාලනය 4.1 තිරසාර සංවර්ධන අරමුණු	
එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් හඳුන්වා දී ඇති ‘‘තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය - 2030’’ ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතු අතර ජාතික තරුණ සේවා සභාව විසින් තම විෂය පථයට ගැනෙන තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි.	තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනා ගනිමින් 2021 වර්ෂයේ ජාතික තරුණ සේවා සභාවේ වැඩසටහන් ක්‍රියාත්මක වෙමින් පවතී. එනම් තිරසාර සංවර්ධන අරමුණු 04 හි 04.4 හා 03 හි 03.4 ඉලක්ක ප්‍රධාන වශයෙන් පදනම් කර ගෙන ඇත.